
# චිත්‍ර කලාව

# 6 ශ්‍රේණිය

## ගුරු අත්පොත

(2015 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# චිත්‍ර කලාව

## ගුරු මාර්ගෝපදේශය

# 6 වන ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක වේ.)**


සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@nie.lk

**චිත්‍ර කලාව**

**6 වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2014**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

*මුද්‍රණය :* මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ළැදියා පුබුදුවා, එමඟින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through Aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, Sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමඟ යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමඟ මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින්ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කර දෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමඟ අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින්ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අප යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තු දේ s | කිය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු අප අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමිකව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දී තර්කානුකූලව හා නිර්මාණාත්මකව චින්තනය මෙහෙයවා ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චිත්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිතව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමානය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්‍යෝගයෙන් හා කැපවීමෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණ** | : | එම්.ජී.ඒ.කේ.යූ.බණ්ඩාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | : | ඥානසිරි බී.ගමගේ මයා - කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**ලේඛක මණ්ඩලය**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ඥානසිරි බී.ගමගේ මයා | : | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| රවීන්ද්‍ර තේනුවර මයා | : | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| චමරි තපස්වරගේ මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| එම්. පී. ප්‍රේමතිලක මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| ආචාර්ය උපාලි රංජිත් රණවක | : | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, බුලත්සිංහල |
| ඒ.එස්.ආරියපාල මයා | : | ස.අ.අ (විශ්‍රාමික), කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම. |
| එල්.එස්.වේහැල්ල මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ |
| බී.ඒ.බී.ඒ. බමුණුසිංහ මයා | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර |
| කේ.ඩී.කේ.ඒ.ගුණරත්න මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, දෙනුවර |
| යූ.එල්.අනුලා රෝහිණී කුලරත්න මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හැටන් |
| අයි.පී.නිරෝෂා විජේසිංහ මිය | : | චිත්‍ර කලා ආචාරිනී, මොරගහහේන මහ විද්‍යාලය |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | : | නිර්මලා දමයන්ති ජයසිංහ මෙනවිය. ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **පිටකවර නිර්මාණය** | : | රවීන්ද්‍ර තේනුවර මයා |
| **පරිගණක යතුරු ලියනය** | : | ලක්ෂමී පෙරේරා මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **විවිධ සහය** | : | ඊ. එම්. වික්‍රමනායක මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා.<br>ප්‍රේමරත්න පෙරේරා මයා, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය, වර්ෂ 2015 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත චිත්‍ර කලාව 6 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සම්පාදනය කර ඇත. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙය ඔබ අතට පත්කෙරේ. මෙම පොත පරිශීලනයේ දී පහත කරුණු පිළිබඳ ව ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න.

- පාසලේ වාර්ෂික වැඩ සැලසුමට අනුකූල වන සේ කාලය කළමනාකරණය කරගන්න.

- ප්‍රධාන නිපුණතා 07 ක් යටතේ පෙළගස්වා ඇති අන්තර්ගතයෙහි 1.0 සිට 5.0 දක්වා වන ප්‍රායෝගික නිපුණතාවන්හි නිපුණතා මට්ටම් සඳහා ආදර්ශ ක්‍රියාකාරකමක් ඇතුළත් කර ඇත. එම නිපුණතා මට්ටම්වලට අදාළ ව යෝජනා කර ඇති මාතෘකා හෝ සුදුසු වෙනත් මාතෘකා පදනම් කරගෙන අනෙකුත් ක්‍රියාකාරකම් නිර්මාණය කරගන්න.

- 6.0 හා 7.0 නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ඇතත්, සුදුසු නිර්මාණශීලී ක්‍රමවේද භාවිත කර, අදාළ විෂය කරුණු සාක්ෂාත් වන සේ ක්‍රියාකාරකම් වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත.

- යෝජිත මෙන් ම සම්පාදනය කර ගන්නා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පහත කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

  I සෞන්දර්ය හෝ වෙනත් විෂය සමෝධානික රසවත් ඉදිරිපත් කිරීම් මඟින් ප්‍රබෝධාත්මක ආරම්භයක් සිසුන් පාඩමට ඇදබැඳ ගැනීමටත්, පෙර දැනුම විමසීමටත්, පොළඹවා ගැනීමත් යන කරුණු ඔස්සේ ක්‍රියාකාරකමට පිවිසිය යුතු ය.

  II සිසුන්ගේ ශක්‍යතා හඳුනාගෙන නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම භාවිත කර, ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙමින් ක්‍රියාකාරකම අවසානයක් කරා ගෙනයාමෙන් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ළඟා විය හැකි ය.

  III ඉදිරිපත් කිරීම්, ඇගයීම් සමාලෝචනය, පසු වැඩ පැවරීම, ඇතුළත් ව සමස්ත පාඩම නිමා කිරීම.

- ගුරු මාර්ගෝපදේශය මගපෙන්වීමක් පමණි. විෂයබද්ධ ග්‍රන්ථ, අන්තර් ජාලය, වැනි මාධ්‍ය පරිශීලනය කිරීමෙන් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද දැනුමෙන් හා අවබෝධයෙන් සන්නද්ධ වීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- හඳුන්වා දී ඇති සියලුම නිපුණතා පුද්ගල පෞරුෂ සංවර්ධනය පදනම් කරගෙන ගොඩනගා ඇති බැවින් එම නිපුණතා 07 ම අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කළ යුතු ය.

  පහත වගුව අනුව ක්‍රියාකාරකම් වාර තුනට බෙදා දැක්විය හැකි ය.

| 1 වාරය | 2 වාරය | 3 වාරය |
|---|---|---|
| ක්‍රියාකාරකම් අංක | ක්‍රියාකාරකම් අංක | ක්‍රියාකාරකම් අංක |
| 1.1.1, 1.1.2,<br>2.1.1<br>3.1.1<br>4.1.1<br>5.1.1<br>6.1.1<br>7.1.1 | 1.1.3, 1.2.1, 1.2.2<br>2.1.2<br>3.2.1,<br>4.1.2<br>5.1.2<br>6.1.2, 6.1.3<br>7.1.2, 7.1.3 | 1.2.3, 1.2.4<br>2.2.1, 2.2.2<br>3.3.1<br>4.2.1, 4.2.2<br>6.1.4<br>7.1.4 |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | iv |
| හැඳින්වීම | v - vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශය | x - xx |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-50 |

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි. | 1.1 පරිසරය ඇසුරෙන් රේඛා චිත්‍ර අඳියි.<br><br>1.2 ස්වභාවික හා නිර්මිත පරිසරය ඇසුරෙන් චිත්‍ර සංරචනය කරයි. | ■ රේඛා චිත්‍ර<br>• පරිසරය අධ්‍යයනය<br>– මානව ඉරියව්<br>– සත්ත්ව ඉරියව්<br>– ශාකමය හා පරිසරයේ වෙනත් වස්තු<br>- නිර්මිත වස්තු<br><br>■ සංරචන මූලිකාංග<br>• රේඛා<br>• හැඩතල<br>• වර්ණ භාවිතය<br>• තලය භාවිතය<br>■ චිත්‍ර සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• පර්යාලෝකය<br>• ත්‍රිමාන ලක්ෂණ<br>• සමබරතාව<br>• හැඟීම් ප්‍රකාශනය<br>• නිමාව<br>■ විවිධ මාධ්‍ය හා ශිල්පක්‍රම<br>• කොලාජ්<br>• පැස්ටල්<br>• දියසායම් | • මානව හා සත්ත්ව ඉරියව්, වෘක්ෂලතා සහ පරිසරයේ වෙනත් හැඩ රේඛාවෙන් ඇඳීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.<br><br>• ස්වභාවික හා නිර්මිත පරිසරය ඇසුරෙන් විවිධ මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිත කරමින් චිත්‍ර සංරචනය කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි. | 2.1 සරල ජ්‍යාමිතික හැඩගත් වස්තු රේඛාවෙන් අඳියි.<br><br>2.2 විවිධ ස්වභාවික වස්තු හා ශාකමය කොටස් රේඛාවෙන් අඳියි. | ■ ජ්‍යාමිතික වස්තු රේඛා ආශ්‍රිත අධ්‍යයනය<br>• රේඛාවේ විවිධතා<br>• ත්‍රිමාන ලක්ෂණ හා එළිය අඳුර<br>– සිලින්ඩරාකාරය<br>– ගෝලය<br>– ශංකුය හා ශංකාභය<br>- කේතුව<br><br>■ ස්වභාවික වස්තු හා සරල ශාක කොටස් අධ්‍යයනය<br>• ශාක කොටස්<br>• ස්වභාවික වස්තු | • සරල ජ්‍යාමිතික හැඩ ඇඳ පැන්සලෙන් වර්ණ කරයි.<br>• විවිධ ශාක කොටස්වල ගති ලක්ෂණ මතුවන සේ පැන්සල භාවිතයෙන් අඳියි.<br>• රේඛාවේ විවිධ ගති ලක්ෂණ, එළිය අඳුර, ත්‍රිමාන ලක්ෂණ ද්‍රව්‍ය බලා ඇඳීමේ චිත්‍ර සඳහා විධිමත්ව භාවිත කරයි. | 06 |
| 3.0 පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි. | 3.1 මූලික වර්ණ භාවිතයෙන් සැරසිලි නිර්මාණය කරයි.<br><br>3.2 ද්විතීයික වර්ණ භාවිතයෙන් සරල ජ්‍යාමිතික හා ස්වභාවික හැඩ වර්ණ ගන්වයි.<br><br>3.3 පාරිභාරික භාණ්ඩ හා ද්‍රව්‍ය සැලසුම් කර වර්ණ ගන්වයි. | ■ මූලික වර්ණ<br>■ විවිධ සැරසිලි<br><br>■ ද්විතීයික වර්ණ අභ්‍යාස<br>• ස්වභාවික හැඩ<br>• ජ්‍යාමිතික හැඩ<br>- වෘත්තය<br>- සමචතුරස්‍රය<br>- ත්‍රිකෝණය<br>- සෘජුකෝණාස්‍රය<br>■ මූලික වර්ණ<br>■ ද්විතීයික වර්ණ<br>• සෙල්ලම් බඩු<br>• තෑගි අසුරන<br>• පැන්සල් රඳවන | • මූලික වර්ණ හා ද්විතීයික වර්ණ භාවිත කරයි.<br>• සරල ජ්‍යාමිතික හැඩ හා ස්වභාවික හැඩ ඇඳ වර්ණ ගන්වයි.<br>• පාරිභාරික භාණ්ඩ හා ද්‍රව්‍ය නිර්මාණය කරයි.<br>• සංයමයෙන් කටයුතු කරයි.<br>• ක්‍රියාකාරකමක් පිළිවෙළින් නිමකරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි. | 4.1 ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා අච්චු මුද්‍රණ ක්‍රම භාවිත කරයි.<br><br>4.2 ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු මුද්‍රණ ක්‍රම භාවිත කරයි. | ■ අවශ්‍යතා<br>■ සැලසුම<br>■ ගැළපීම<br>■ සමබරතාව<br>■ වර්ණ මාධ්‍ය<br>■ මුද්‍රණය සඳහා සුදුසු බව<br>■ නිර්මාණාත්මක බව<br>■ සරල මුද්‍රණ ශිල්ප ක්‍රම<br>• අච්චු මුද්‍රණ ක්‍රම<br>• සිදුරු තහඩු මුද්‍රණ ක්‍රම | • ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා අච්චු මුද්‍රණ භාවිත කොට මුද්‍රණ පිටපත් ලබා ගැනීමේ හැකියාව ලබයි.<br><br>• ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු මුද්‍රණ පිටපත් ලබා ගැනීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි. | 14 |
| 5.0 විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි. | 5.1 ඇඹීම හා එකලස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් මූර්ති නිර්මාණය කරයි.<br><br>5.2 විවිධ මාධ්‍ය භාවිතයෙන් චලන මූර්ති නිර්මාණය කරයි. | ■ ඇඹීමේ ශිල්ප ක්‍රම<br>■ එකලස් කිරීමේ ශිල්ප ක්‍රමය<br>■ සරල හැඩ ඇඹීම හා ගොඩනැඟීම<br>■ මෘදු මාධ්‍ය<br><br>■ චලන මූර්ති ආශ්‍රිත විවිධ ශිල්ප ක්‍රම<br>■ සරල හැඩ<br>■ විවිධ මාධ්‍ය<br>■ නිර්මාණාත්මක බව<br>■ සමබරතාව හා චලනය | • ඇඹීමේ හා එකලස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනියි.<br>• සරල හැඩ අඹයි.<br>• විවිධ මාධ්‍ය භාවිතයෙන් සරල හැඩ ගොඩනගයි.<br>• මෘදු මාධ්‍ය භාවිතයෙන් නිර්මාණකරණයේ යෙදෙයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කෘතින්, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි. | 6.1 විවිධ ආගමික උත්සව හා ජාතික උත්සව අවස්ථාවන් හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි. | ■ බෞද්ධ<br>• වෙසක් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග<br>■ හින්දු<br>• තෛපොංගල් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග<br>■ ඉස්ලාම්<br>• රාමසාන් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග<br>■ ක්‍රිස්තියානි<br>• නත්තල් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග | • විවිධ ආගමික උත්සව අවස්ථාවල මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• විවිධ ආගමික උත්සව අංග සඳහා බලපෑ විවිධ ආභාස හා සුවිශේෂ අනන්‍යතා විග්‍රහ කරයි. | 04 |
| 7.0 දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි. | 7.1 විවිධ ආගමික බලපෑම් ඇසුරෙන් සම්භවය වූ කලා අංග අධ්‍යයනය කරයි.<br><br>7.2 දේශීය සම්ප්‍රදායික සැරසිලි නිර්මාණ අධ්‍යයනය කරයි. | ■ මූලිකාංග හා කලා ලක්ෂණ<br>• බෞද්ධ - ස්ථූපය<br>• හින්දු - කෝවිල<br>• ඉස්ලාම්- මස්ජිදය<br>• ක්‍රිස්තියානි-දේවස්ථානය<br>■ සිංහල සැරසිලි නිර්මාණකරණයේ පදනම<br>• අභ්‍යාසකරණය<br>- යටිපෝරුව, වකදෙක, ලියපත, තිරිඟිතලය,<br>– වර්ණ භාවිතය | • විවිධ ආගමික කලා අංග හඳුනා ගනියි.<br>• මූලිකාංග හා කලා ලක්ෂණ අධ්‍යයනය කරයි.<br>• සංස්කෘතික වශයෙන් ඇති වෙනස්කම් නම් කරයි.<br>• දේශීය සම්ප්‍රදායික සැරසිලි මෝස්තරවල විශේෂතා හඳුන්වා වර්ග කිරීම කරයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • සැරසිලි මූලිකාංග වර්ගීකරණය<br>- දිව්‍ය, සත්ත්ව, උද්භිද, නිර්ජීවී<br>• නිර්ජීවී ගණයට අයත් සැරසිලි<br>– අරිම්බුව<br>– ගල්බින්දුව<br>– කුන්දිරක්කන්<br>– පනාව<br>– තනිපොට ලණුව<br>– දෙපොට ලණුව | | |

# ඉගෙනුම් ඉගෙන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1** : **පරිසරය ඇසුරෙන් රේඛා චිත්‍ර අඳියි.**

**ක්‍රියාකාරකම 1.1.1** : **අපේ පාසල් වත්ත**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :

- ගස්වල විවිධත්වය, විසිතුරු බව, පිළිබඳ ව අදහස් දක්වයි.
- ගස්වල කඳ, අතු, රිකිලි වල රිද්මය ශාක පත්‍රවල දක්නට ඇති රටා පිළිබඳ දැනුවත්ව කටයුතු කරයි.
- තෝරාගත් ගස් කිහිපයක් රේඛාවෙන් අධ්‍යයනය කරයි.
- රේඛාකරණයේ දී පැන්සල මගින් අඳුර, එළිය පෙන්වීමේ ක්‍රමවේද අත්හදා බලා ක්‍රියාවට නංවයි.

**ගුණාත්මක යෙදවුම්** :

- වපරිසරයේ ඇති වෘක්ෂලතා, ආධාරක පුවරු 2B, 4B කාණ්ඩයේ පැන්සල්, කඩදාසි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීමට උපදෙස්** :

**පියවර 1.1.1.1** :

- පාසල ආශ්‍රිත ස්වභාවික පරිසරය, පිළිබඳ චිත්ත රූප මැවෙන සේ පද්‍ය හෝ ගද්‍ය මාර්ගයෙන් සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- පාසල් පරිශ්‍රයේ ගස් ආශ්‍රිත ස්වභාවික පරිසරය වෙත සිසුන් කැඳවාගෙන යන්න.
- ගස්වල විවිධ බව, විසිතුරු බව හා පරිසරයට හැඩ ගැසී ඇති අයුරු පිළිබඳ සිසුන් විමසමින් කෙටි සාකච්ඡාවක යෙදෙන්න.
- ගස්වල ඇති විවිධත්වය, රේඛාව විවිධ අයුරින් භාවිත කිරීමෙන් පෙන්නුම් කළ හැකි අයුරු පහදා දෙන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 1.1.1.2** :

- පරිසරය නිරීක්ෂණය කරමින් චිත්‍ර නිර්මාණයට පහසු වනසේ සුදුසු අයුරින් සිසුන් ස්ථානගත කිරීමට කටයුතු කරන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- අවශ්‍ය තැන්හිදී ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙන්න.
- නිම වූ කෘති පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 1.1.1.3** :

- නිර්මාණ, සුදුසු ක්‍රමවේදයන් භාවිත කරමින් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන්න.
- තම නිර්මාණ පිළිබඳ ව අදහස් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.
- සිසු ඇගයීම අවසානයේ සිසු නිර්මාණ පිළිබඳ ව සංවර්ධනාත්මක ක්‍රම තවදුරටත් මතුවන වන සේ කෙටි සමාලෝචනයක යෙදෙන්න.

- රේඛාව විවිධ ආකාරයෙන් හැසිරවීම මගින් චිත්‍රමය ගුණාංග මතුවන සේ රුවක් නිර්මාණයක් කළ හැකි බව අවධාරණය කරන්න.

(මිනිත්තු 20 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ස්වභාවික හා නිර්මිත පරිසරයේ ඇති සුවිශේෂී, ලක්ෂණ ප්‍රකාශ කිරීම
- ගස් රැක ගැනීමෙන් අපත් රැකෙන බව පිළිගැනීම
- පරිසරය හොඳින් නිරීක්ෂණය කරමින් රේඛාවෙන් ඇඳීමේ කුසලතාවය ප්‍රදර්ශනය කිරීම
- ශාක ප්‍රජාව රැකගැනීමට කැමැත්ත ප්‍රකාශ කිරීම
- රේඛා අධ්‍යයනය පිළිබඳ හුරුව වෙනත් නිර්මාණ සඳහා යොදාගත හැකි බව ප්‍රකාශ කිරීම

පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.

1.1.2 නිතර දකින සතුන් රේඛාවෙන් අඳිමු - කාලච්ඡේද 02

1.1.3 මානව රූපයක විවිධ ඉරියව් රේඛාවෙන් අඳිමු - කාලච්ඡේද 02

**නිපුණතාව 1.0 : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.2 : ස්වභාවික හා නිර්මිත පරිසරය ඇසුරෙන් චිත්‍ර සංරචනය කරයි.**

**ක්‍රියාකාරකම 1.2.1 : සුවඳ මලයි - සමනලයයි**

**කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි**

**ඉගෙනුම් පල :**

- උචිත වර්ණ කඩදාසි තෝරා ගනියි.
- වර්ණවත් කඩදාසි විවිධ හැඩවලට ඉරා ඇලවීමෙන් කොලාජ් චිත්‍ර නිර්මාණය කරයි.
- චිත්‍ර නිර්මාණයේ දී එක් ක්‍රමයක් ලෙස කොලාජ් මාධ්‍යය ද භාවිත කළ හැකි බව පිළිගනියි.
- මල් හා සමනලයින් නිසා පරිසරයේ ස්වභාවික සෞන්දර්යය /සොබා සුන්දරත්වය වැඩිවන බව පවසයි.

**ගුණාත්මක යෙදවුම් :**

- වර්ණවත් කඩදාසි කැබලි, ගම්, මල් ගහ, කොළ වැල්, සමනලයින් සහිත ආදර්ශ චිත්‍ර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීමට උපදෙස් :**

**පියවර 1.2.1.1 :**

- ආදර්ශ කොලාජ් චිත්‍ර ප්‍රදර්ශනය කරන්න.
- මල් පැණි බොන සමනලයින් නිසා පරිසරයේ ඇතිවන චමත්කාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- චිත්‍ර සංරචනයේ දී කොලාජ් මාධ්‍ය භාවිත කිරීමෙන් ද නිර්මාණ කළ හැකි බව අවධාරණය කරන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 1.2.1.1 :**

- මාතෘකාවට උචිත හැඩතල තලයට ගැළපෙන සේ ඇඳීමට ඉරා ගැනීමට සිසුහු යොමු කරවන්න.
- සපයාගත් වර්ණ කඩදාසි හැඩතලවලට ගැළපෙන සේ හැඩ ඉරීමට ද උචිත වර්ණ රටා මතුවන සේ පාට කඩදාසි තෝරා ගැනීමට ද සිසුන් යොමු කරවන්න.
- අවශ්‍ය තැන්හි සිසුනට ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙන්න.
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කර නිර්මාණ ප්‍රදර්ශනය කරවීමට කටයුතු කරන්න. (මිනිත්තු 95 යි)

**පියවර 1.2.1.1 :**

- ප්‍රදර්ශනය කර ඇති කොලාජ් චිත්‍ර පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීම සඳහා සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන්ගේ නිර්මාණ පිළිබඳ ව සංවර්ධනාත්මක ව සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 20යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- වර්ණවත් කඩදාසි ඉරා අලවා ගැනීමෙන් චිත්‍ර නිර්මාණය කරගත හැකි බව පැවසීම
- චිත්‍රයට උචිත වර්ණ කඩදාසි තෝරා භාවිතයට ගැනීම
- කොලාජ් භාවිත කිරීමේ සුදුසු ක්‍රමවේදය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම
- චිත්‍රයේ නිමාව කෙසේ සිදුවිය යුතුදැයි අවසන් කිරීම

පහත මාතෘකාව යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.

1.2.2 අම්ම මාව දොයිකරන්න හදපු හැටි අගෙයි - කාලච්ඡේද 03

1.2.3 සෙනඟ පිරෙන ගමේ කඩේ - කාලච්ඡේද 04

1.2.4 ආගමික වතාවත් - කාලච්ඡේද 04

**නිපුණතාව 2.0 : පරිසරයේ පවත්නා වස්තූන් සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.1 : සරල ජ්‍යාමිතික හැඩගත් වස්තු රේඛාවෙන් අඳියි.**

**ක්‍රියාකාරකම 2.1.1 : ගෝලාකාර වස්තූන්ගේ හැඩ රේඛාවෙන් අඳිමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි

**ඉගෙනුම් පල :**
- ගෝලාකාර හැඩ හඳුනා ගනියි.
- රේඛාවේ විවිධ ගති ලක්ෂණ අවබෝධ කරගනියි.
- ඕනෑම වස්තුවක මූලික හැඩය හඳුනාගෙන එය රේඛාවෙන් අඳියි.
- ගෝලාකාර වස්තුවක් ත්‍රිමාන ලක්ෂණ මතුවන සේ පැන්සලෙන් වර්ණ කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- ගෝලාකාර වස්තු කිහිපයක්
- 2B, 4B පැන්සල්
- ගෝලාකාර වස්තු දක්වෙන නිදර්ශන චිත්‍ර
- චිත්‍ර ඇඳීමේ පුවරුවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීමට උපදෙස් :**

**පියවර 2.1.1.1 :**
- සපයා ගත් බෝල සිසුන්ගේ අතින් අත යවන්න.
- එම හැඩය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- එවැනි වෙනත් භාණ්ඩ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.1.2 :**
- සිසුන්ට නිරීක්ෂණය කිරීමට පහසුවන සේ යෝජිත ගෝලාකාර වස්තුව (ඇස් මට්ටමෙන් පහළ) චිත්‍ර ඇඳීමේ පුවරුවක් මත තබන්න.
- තලයට ගැළපෙන පරිදි ඇඳගත් බෝලයේ එළිය, අඳුර පෙන්වන්න.
- පැන්සල් තුඩෙන් පාට කිරීම හා පැන්සල පැත්තට හරවා පාට කිරීමේ වෙනස පැහැදිලි කරන්න.
- සිසු නිර්මාණ සුදුසු ක්‍රමවේදයක් භාවිත කර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 2.1.1.3 :**
- ප්‍රදර්ශනය කර ඇති නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමකට ඉඩ ලබාදෙන්න.
- රේඛාවෙන් ත්‍රිමාන බව හා එළිය අඳුර පෙන්වන හැකි බව සිසුන් සමඟ කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ගෝලාකාර වස්තූන් හඳුනා ගැනීම
- රේඛාවේ ක්‍රම ශිල්ප නිවැරදි ව භාවිත කිරීම
- වස්තූන්ගේ මූලික අන්තර්ගතය හඳුනාගෙන  තලයට ගැළපෙන ලෙස ඇඳීම
- වස්තූන්වල එළිය, අඳුර, ත්‍රිමාන බව අවබෝධ කරගෙන පැන්සල හැසිරවීම

පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම සැලසුම් කරගන්න.

2.1.2 සරල ජ්‍යාමිතික හැඩගත් වස්තු රේඛාවෙන් අඳිමු. - කාලච්ඡේද 02
(ඝනකය, ඝනකාභය හා කේතුව)

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තූන් සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.2** : **විවිධ ස්වභාවික වස්තු හා ශාකමය කොටස් රේඛාවෙන් අඳියි.**

**ක්‍රියාකාරකම 2.2.1** : **සිලින්ඩරාකාර හැඩයක් හා ශාකමය කොටස් රේඛාවෙන් අඳිමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :

- සිලින්ඩරය වෘත්තාකාර මුහුණත් දෙකකින් හා වක්‍රාකාර පෘෂ්ඨයකින් යුතු හැඩයක් බව ප්‍රකාශ කරයි.
- රේඛාවේ විවිධ ගති ලක්ෂණ භාවිත කරයි.
- ද්‍රව්‍ය ඇඳීමේ දී එළිය, අඳුර යෙදීමෙන් ත්‍රිමාන ලක්ෂණ මතු කරයි.
- යම් වස්තුවක් /අතු රිකිල්ලක් හොඳින් නිරීක්ෂණය කිරීමෙන් එය ඇඳීමට පහසුවන බව අවබෝධ කරගෙන අඳියි.

**ගුණාත්මක යෙදවුම්** :

- සිලින්ඩරාකාර හැඩ සහිත භාජන (හිස් ජෑම් බෝතලයක්, හිස් කිරිපිටි ටින් එකක් හෝ ලීටර් 1 හිස් තීන්ත ටින් එකක්)
- පළල් පත්‍ර තුනක් සහිත ක්‍රෝටන් අත්තක්
- පැන්සල් 2B/ 4B වර්ගයේ පැන්සල්
- චිත්‍ර අඳින කඩදාසි
- චිත්‍ර ඇඳීමේ පුවරු

**ක්‍රියාකාරකම සැලසුම් කිරීමට උපදෙස් :**

**පියවර 2.1.2.1** :

- විවිධ සිලින්ඩර හැඩ හා ක්‍රෝටන් අත්ත ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ විමසමින් පාඩමට පිවිසෙන්න.
- සිලින්ඩරය වෘත්තාකාර මුහුණත් දෙකකින් හා වක්‍රාකාර පෘෂ්ඨයකින් යුතු බව සාකච්ඡා කරන්න.
- සිලින්ඩරයට එළිය අඳුර යෙදීමෙන් ත්‍රිමාන ලක්ෂණ මතුවන ආකාරය සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.2.2** :

- ඇඳීමේ කඩදාසි හා අවශ්‍ය පැන්සල් සිසුන්ට ලබා දෙන්න.
- යෝජිත වස්තූන් සිසුන්ට නිරීක්ෂණ කිරීමට පහසුවන අයුරින් පන්තිය ඉදිරියේ (ඇස් මට්ටමෙන් පහළ) චිත්‍ර ඇඳීමේ පුවරුවක් මත තබන්න.
- 2B, 4B පැන්සලය භාවිත කර රේඛාවේ විවිධ ගති ලක්ෂණ මතුකරන ආකාරය ආදර්ශනය කරන්න.
- ක්‍රෝටන් අත්ත හා සිලින්ඩරය හොඳින් නිරීක්ෂණය කිරීමෙන් ඇඳීමට පහසුවන ආකාරය පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 2.1.2.3** :
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්මාණ පිළිබඳ ව ස්වයං ඇගයීමකට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිර්මාණ පිළිබඳ ව සංවර්ධනාත්මක ව අදහස් ඉදිරිපත් කිරීමට අනෙකුත් සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සමස්ත ක්‍රියාකාරකම ආවරණය වන පරිදි කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සිලින්ඩරාකාර හැඩ නම් කිරීම
- රේඛාව විවිධ ගති ලක්ෂණ යොදා සිලින්ඩරය හා ක්‍රෝටන් අත්ත ඇඳීම
- ද්‍රව්‍යවලට එළිය අඳුර යෙදීමෙන් ත්‍රිමාන ලක්ෂණ මතු කළ හැකි බව පැහැදිලි කිරීම
- ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කිරීම
- අන් අයගේ නිර්මාණ අගය කිරීම

පහත මාතෘකාව යටතේ අනෙකුත් ක්‍රියාකාරකම සැලසුම් කරගන්න.

2.2.2 ස්වභාවික හැඩගත් වස්තු රේඛාවෙන් අඳිමු - කාලච්ඡේද 02

නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම 3.1 : මූලික වර්ණ භාවිතයෙන් සැරසිලි නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 3.1.1 : ''නිල්, කහ, රතු යොදමු අලුත් රටා මවමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි.

ඉගෙනුම් පල :
- මූලික වර්ණ නම් කරයි.
- නිවැරදි උපකරණ භාවිත කරයි.
- නිවැරදිව හැඩයක් ඇඳ අච්චුවක් සකස් කරගනියි.
- නිතැතින් මතුවන අලංකාර ස්වභාවයන් දැක වින්දනයක් ලබයි.
- රටාවකට හැඩතල අලවයි.
- විධිමත් රටාවක් ගොඩනැගීමෙන් ක්‍රමවත් ව යමක් කිරීමට හුරුවෙයි.

ගුණාත්මක යෙදවුම් :
- බ්‍රිස්ටල් බෝර්ඩ්, කතුරු ගම්, රළු මතුපිටක් සහිත (ලේස්, ගෝනි) වැනි ද්‍රව්‍යයක්
- සුදු ඩ්‍රොවින් කඩදාසියක්
- නිල්, කහ, රතු බැලුන්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 3.1.1.1 :
- නිල්, කහ, රතු වර්ණවත් බැලුන් කීපයක් සිසුන්ට ලබා දී සුළං පිරවීමට සලස්වන්න.
- එම බැලුන් ගැට ගසා සිසුන්ට පෙනෙන පරිදි පන්තියේ රඳවන්න.
- පන්තියේ ප්‍රදර්ශනය වන බැලුන් වල වර්ණ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- මූලික වර්ණ භාවිත කිරීමෙන් නිර්මාණයක් කළ හැකි බව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

පියවර 3.1.1.2 :
- ඇමුණුම 3.1.1.1 ට ඇතුළත් ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව සුදුසු පරිදි භාවිත කරමින් සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- අවශ්‍ය තැන්හි දී ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ දෙමින් සහාය වන්න.
- සිසු නිර්මාණ පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 40යි)

පියවර 3.1.1.3 :
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් සිසු නිර්මාණ ප්‍රදර්ශනයට කටයුතු කරන්න.
- ස්වයං ඇගයීමකට ඉඩ ලබාදෙන්න.
- අන් අයගේ නිර්මාණ ඇගයීමට සිසුන් මෙහෙයවන්න.
- සිසුන්ගේ නිර්මාණ තවදුරටත් සංවර්ධනය කර ගැනීමට

උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- මූලික වර්ණ නම් කිරීම
- නිර්මාණ කරගත් අච්චුවක් මගින් හැඩතල පිටපත් කර ගත හැකි බව පිළිගැනීම
- අච්චුව මගින් ඇඳගත් හැඩතලවලට මූලික වර්ණ යෙදීම
- රටාවක් මතුවන සේ හැඩතල භාවිත කිරීම
- පසුබිම අලංකරණය සඳහා විවිධ ක්‍රම ශිල්ප උපයෝගි කරගැනීම

**ඇමුණුම 3.1.1.1**

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- සරල මතුපිටක් සහිත පත්‍ර කීපයක් ආදර්ශ ආකෘති ලෙස ගන්න.
- තෝරාගත් ආදර්ශය ඇසුරෙන් අච්චුව සඳහා හැඩයක් බ්‍රිස්ටල් බෝර්ඩ්වල ඇඳ කපා ගන්න.
- කපාගත් එම හැඩය ඩ්‍රොවින් කඩදාසියේ තබා සැරසිල්ලට අවශ්‍ය පමණ පිටපත් ඇඳගන්න.
- නිල්, කහ, රතු යොදා පිටපත් කළ හැඩතල වර්ණ කර ගන්න.
- එම චිත්‍ර හැඩ කපා වෙන්කර ගන්න.
- සැරසිල්ල කරන කඩදාසිය ගෝනි, ලේස් වැනි රළු මතුපිටක තබන්න.
- කළු වර්ණ පැස්ටල් කූර පෙරළා සමස්ත තලයම මෘදුව (සැහැල්ලු අනිත්) වර්ණ කරන්න.
- රළු ද්‍රව්‍යයෙහි මතුපිට ස්වභාවය නිතැතින් මතුවන අයුරු අවධානයට ගන්න.
- කපාගත් හැඩ සමබර වන සේ වර්ණ කළ කඩදාසියේ අලවා ගන්න.
- ඇලවීමේ දී මිණුම් ක්‍රම ඇසුරෙන් විධිමත් රටාවක් ගොඩනගා ගන්න.

**නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.2 : ද්විතීයික වර්ණ භාවිතයෙන් සරල ජාමිතික හා ස්වභාවික හැඩ වර්ණ ගන්වයි.**

**ක්‍රියාකාරකම 3.2.1.1 : ද්විතීයික වර්ණ භාවිත කර තෑගි දවටනයක් නිර්මාණය කරමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි**

**ඉගෙනුම් පල :**
- ද්විතීයික වර්ණ භාවිත කර නිර්මාණ කරයි.
- නිවැරදි ව උපකරණ භාවිත කරයි.
- වර්ණ හා හැඩ සමබරව ගළපයි.
- සංයමයකින් යුතුව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- ඇමුණුම 3.2.1.1 ට අදාළ ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව
- බ්‍රිස්ටල් බෝර්ඩ්, පැස්ටල්, දියසායම්, කතුරු පින්සල් සුදු ඩ්‍රෝවින් කඩදාසි
- සුදු කඩදාසියක හා වර්ණවත් අලංකාර මුද්‍රිත කොළයකින් ඔතන ලද (හිස් පෙට්ටි) ත්‍යාග ආදර්ශ දෙකක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

**පියවර 3.2.1.2 :**
- ත්‍යාග ආදර්ශන භාවිත කර පාඩමට පිවිසෙන්න.
- ත්‍යාග දෙන අවස්ථා පිළිබඳව හා පූර්ව අත්දැකීම් සාකච්ඡාවට ගන්න.
- ත්‍යාග දවටනයක් නිර්මාණය සඳහා සිසුන් පොළඹවා ගන්න.

(මිනිත්තු 10 යි.)

**පියවර 3.2.1.2**
- ඇමුණුම 3.2.1.1 ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව සුදුසු පරිදි කළමනාකරණය කරමින් සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- නිර්මාණයට අවශ්‍ය බ්‍රිස්ටල් බෝර්ඩ්, පැස්ටල්, දියසායම්, කතුරු, පින්සල්, ඩ්‍රොවින් කඩදාසි ආදිය සිසුන්ට බෙදා දෙන්න.
- ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාවට අනුව සකස් කරගන්නා අච්චු හා වර්ණ භාවිත කොට තෑගි දවටනයකට සුදුසු මෝස්තරයක් (ටෙම්ප්ලේට් ක්‍රමයට) නිර්මාණයට යොමු කරවන්න.
- මනා නිමාවක් තිබිය යුතු බවට සිසුන් දැනුවත් කරන්න.

(මිනිත්තු 90යි.)

**පියවර 3.2.1.3 :**
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න
- නිර්මාණ පිළිබඳ ව සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අනෙකුත් සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- නිර්මාණයේ නිමාව හැඩ හා ද්විතීයික වර්ණවල සමබරතාව, නිවැරදි උපකරණ භාවිතය ආදී මූලික කරුණු මතු කරමින් සමස්ත ක්‍රියාවලිය පිළිබඳ කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 20 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ද්විතීයික වර්ණ නම් කිරීම
- නිවැරදි ව උපකරණ භාවිත කර හැඩ කපා ගැනීම
- හැඩ හා මූලික වර්ණ සමබරව, මනා නිමාවකින් යෙදීමෙන් නිර්මාණය සාර්ථක වන බවට අදහස් දැක්වීම
- අන් අයගේ නිර්මාණ අගය කිරීම
- සංයමයකින් යුතු ව නිර්මාණකරණයේ යෙදීම

**ඇමුණුම 3.2.1.1**

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- පංතිය ඉදිරියේ ප්‍රදර්ශනය කර ඇති වර්ණවත් තෑගි පාර්සලය හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට ලැබී ඇති බ්‍රිස්ටල් බෝර්ඩ් භාවිත කර වෘත්තය, සමචතුරශ්‍රය, ත්‍රිකෝණය සෘජුකෝණාශ්‍රය යන හැඩ සුදුසු පරිමාණයෙන් කපාගන්න.
- කපාගත් හැඩතල කෙළවර ද්විතීයික වර්ණ මාරුවෙන් මාරුවට හොඳින් ආලේප කරන්න.
- වර්ණ තවරාගත් හැඩය ඩ්‍රොවින් කඩදාසිය මත තබා වටේට ඇඟිල්ලෙන් පිරිමැද හැඩයේ ඇති වර්ණ කඩදාසිය මත තවරා ගන්න.
- වර්ණ තැවරීමෙන් හැඩතලයේ හැඩය ඩ්‍රොවින් කඩදාසියේ වර්ණයෙන් ඉතිරිවන සේ සමබරව යෙදීමට කටයුතු කරන්න.
- මුද්‍රණය කරගත් හැඩතලයේ මැද කොටසෙහි දිය සායම් හෝ පැස්ටල් මාධ්‍ය භාවිත කර මලක් වැනි හැඩයක් අඳින්න.
- තම නිර්මාණය පිරිසිදුව හා මනා නිමාවකින් යුතු ව නිම කිරීමට අවධානය යොමු කරන්න.
- නිමකළ නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට හා අදහස් දැක්වීමට සූදානම් වන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරුතුමා/ගුරුතුමිය ගේ සහාය ලබාගන්න.

නිපුණතාව 3.0 : **පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.**

නිපුණතා මට්ටම 3.3 : **පාරිභාරික භාණ්ඩයක් සැලසුම් කර වර්ණ ගන්වයි.**

ක්‍රියාකාරකම 3.3.1 : **පාරිභාරික භාණ්ඩයක් මූලික හා ද්විතීයික වර්ණ භාවිත කර අලංකාර කරමු.**

කාලච්ඡේද සංඛ්‍යාව : 3 යි.

ඉගෙනුම් පල :
- පරීක්ෂණය, නිරීක්ෂණය මගින් ද්විතීයික වර්ණ හඳුනා ගනියි.
- විසිතුරු මල් බඳුනක් නිර්මාණය කරයි.
- පාරිභාරික භාණ්ඩයක අලංකාරය දැක සතුටු වෙයි.
- සාමූහික ක්‍රියාකාරකමක යෙදී මනා වූ ප්‍රතිඵල ලබාගනියි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.3.1.1 ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව
- විනිවිද පෙනෙන වීදුරු තුනක් නිල්, කහ, රතු දියසායම්, ඉවතලන කිරි හට්ටියක්, කොහු ලණු /ගම්/ඉරටු/කම්බි, දම්, කොළ, තැඹිලි වර්ණ A4 කඩදාසි, ඉරටු, ගම් ටේප්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 3.3.1.1 :
- දියකර මූලික වර්ණ වීදුරුවලට පුරවන්න. (මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරන්න)
- විනිවිද පෙනෙන වීදුරු හා දියකර ගත් මූලික වර්ණ ඇසුරෙන් ද්විතීයික වර්ණ සැදෙන අයුරු පන්තියට ප්‍රදර්ශනය කරන්න. (මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරන්න)
- ද්විතීයික වර්ණ විසිතුරු නිර්මාණයන්ට යොදාගත හැකි බව සිසුන් සමග කෙටි සාකච්ඡාවක යෙදෙන්න.
- මල් බඳුන සැකසීම පිළිබඳ ව ද සිසුන් දැනුවත් කරන්න.

(මිනිත්තු 10යි.)

පියවර 3.3.1.2 :
- අවමය සංඛ්‍යාව 05 වන සේ සිසුන් කණ්ඩායම් ගත කරන්න.
- ගවේෂණ කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- අවශ්‍යතාව අනුව කණ්ඩායම් වෙතට උපකරණ බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- පෙති පහක මලක් සඳහා පතොරමක් සකසා ගැනීමට සහාය වන්න.
- මනා නිමාවකින් යුත් මල,නටුව හා පත්‍රයකින් යුක්ත විය යුතු බව සිසුන්ට පවසන්න.
- ගැටලු සහගත අවස්ථාවන් හි දී සිසුනට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- සිසු නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්ත 90යි.)

පියවර 3.3.1.3 : 
- සකසා ගත් සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කරමින් ඇගයීමක යෙදෙන්න.
- වැඩිදුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ අවබෝධය ලබාදෙන්න.
- ද්විතීයික වර්ණ ඇසුරින් සකසා ගත් පාරිභාරික භාණ්ඩ පිළිබඳ අදහස් දක්වමින් කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ද්විතීයික වර්ණ නම් කිරීම
- මූලික වර්ණ දෙකක් සමානුපාතිකව එකතු වීමෙන් ද්විතීයික වර්ණ සෑදෙන අයුරු ප්‍රකාශ කිරීම
- ද්විතීයික වර්ණ කඩදාසි තෝරාගෙන මල් සැකසීම
- සාමූහික ක්‍රියාවක් සාර්ථක නිර්මාණයක් කළ හැකි බව ප්‍රකාශ කිරීම

ඇමුණුම 3.3.1.1

## ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

- මලක් සකස් කරගැනීම මල් පෙත්තක පතොරමක් නිර්මාණයට ගුරුතුමාගේ සහාය ලබාගන්න.
- තෝරාගත් ද්විතියික වර්ණ සහිත කඩදාසියේ පතරොම භාවිතයෙන් මල් පෙති අවශ්‍ය පමණ ඇඳගන්න.
- නිර්මාණය කරනු ලබන මලෙහි හැඩයට ගැළපෙන සේ පත්‍රයක් ද සකසා ගන්න.
- කපා ගත් මල් පෙති කම්බි/ඉරටු අනෙකුත් ද්‍රව්‍ය භාවිත කර නටුවක් සහිත මලක් නිර්මාණය කරගන්න.
- මල් නටුව ගම් ටේප් කඩදාසි තීරුවලින් ආවරණය කරගන්න.
- මල් දැමීම සඳහා බඳුන සැකසීම ඔබ කණ්ඩායමට ලැබුණි නම් ඒ පිළිබඳ ගුරුභවතාගේ සහාය ලබාගන්න.
- මල් රැඳවීමට ඉවත ලන කිරිහට්ටියේ මතු පිට කොහු ලණු සුදුසු ක්‍රම ශිල්ප භාවිත කරමින් ආවරණය කරගන්න.
- මේ සඳහා ගුරු භවතාගේ සහාය ලබාගන්න.
- කොහු ලණුව වර්ණ ගන්වන්නේ නම් වඩාත් අලංකාර වන බව පවසන්න.

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.1** : **ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා අච්චු මුද්‍රණ ක්‍රමය භාවිත කරයි.**

**ක්‍රියාකාරකම 4.1.1** : **ළමා පොත් පිටකවරයක් නිර්මාණය කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල** :
- සරල සමතල මුද්‍රණයක් හඳුනාගනියි.
- පොත් පිටකවරයක තිබිය යුතු සුවිශේෂී අංග පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.
- අක්ෂරකරණයේ දී වැදගත් වන සියුම් නිමාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- උපකරණ භාවිතය පිළිබඳ හුරුව ප්‍රදර්ශනය කරයි.
- සරල මුද්‍රණ ක්‍රම භාවිතයෙන් පොත් පිටකවරයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 4.1.1.1 ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව
- සීල් මුද්‍රණය සඳහා අර්තාපල්, කුරුම්බැට්ටි, ස්වභාවික කොළ වර්ග, අත්ල හෝ වෙනත් ආදේශක ද්‍රව්‍ය
- ඩ්‍රොයින් කඩදාසි
- පේපර් කටර්
- පින්සල්, දියසායම්, පෝසටර් සායම්
- තෝරාගත් මුද්‍රිත ළමා පොත් පිටකවර ආදර්ශ කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

පියවර 4.1.1.1 :
- පෙර සූදානම් කරගත් සිසුවෙකු මගින් බස් රථයකට ගොඩවන පොත් වෙළෙන්දෙකුගේ භූමිකා රංගනය මඟින් ළමා පොත් පිළිබඳ අවධානය සිසුන් වෙත යොමු කරන්න.
- ගුරු මේසය මත සිසුවා විසින් ප්‍රදර්ශනය කරනු ලැබූ ළමා පොත් ඇසුරු කරගනිමින්, පිටකවරය, සැලසුම, රූප වර්ණ හා අක්ෂර පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පොත් පිටකවර නිර්මාණය ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් වන බව ප්‍රකාශ කරන්න.
- පොත් පිටකවරයක් නිර්මාණයේ දී මුල් හා පසු කවරය මෙන් ම පොතේ සනකම ද සැලකල්ලට ගත යුතු අතර, අදාළ වයස් මට්ටම පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බව සිහිපත් කරන්න.

(මිනිත්තු 10 යි.)

පියවර 4.1.1.2 :
- ගැළපෙන පරිදි අවම සංඛ්‍යාව සිසුන් 4 ක් හෝ 5 ක් පමණ වන සේ කණ්ඩායම් කරන්න.

- ඇමුණුම 4.1.1. ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාවේ පිටපත් සිසුන් අතර බෙදා දෙන්න.
- පොත් පිටකවරයේ මුල් කවරය පොතෙහි සනකම, පසු කවරය සැලසුම් කරන අයුරු ආදර්ශ සටහන් මඟින් පැහැදිලි කරන්න.
- ගවේෂණ / කාර්යය උපදෙස් පත්‍රිකාව අනුව ළමා පොත් පිටකවරය නිමකර පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි.)

**පියවර 4.1.2.3** :

- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- එම නිර්මාණ පිළිබඳව සිසුනට අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න.
- ලබා ඇති ශක්‍යතා මට්ටම අවබෝධ කරගනිමින් සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ අවබෝධය ලබාදෙන්න.
- ග්‍රැෆික් නිර්මාණකරණයේදී සැලකිලිමත් විය යුතු, පිරිසිදු බව, සියුම් බව, නිමාව හා පාරිභෝගික ආකර්ශනය ගැන පැහැදිලි කර දෙන්න.

(මිනිත්තු 20 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- පොත් පිටකවරයක තිබිය යුතු මූලික අංග පිළිබඳ විස්තර කිරීම
- නිර්මාණකරණයේ දී නැවත පිටපත් කර අඳින ලද අක්ෂර හොඳ නිමාවකින් යුතු බව පිළිගැනීම
- සමතල මුද්‍රණ ක්‍රමයක් ඇසුරුකර ගනිමින් පොත් පිටකවරයක් නිර්මාණය කිරීම
- සරල මුද්‍රණ ක්‍රම අනෙකුගේ නිර්මාණ අවස්ථා සඳහා උපයෝගි කර ගැනීම
- අනුපිළිවෙළින් කටයුතු කිරීම
- කලින් සැලසුම් කරන ලද රේඛා සටහන පිටපත් කර නැවත ඇඳීමෙන් නිර්මාණය වඩා ඉහළ මට්ටමේ නිමාවක් ලබාගත හැකි බව පිළිගැනීම

ඇමුණුම 4.1.1.1

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්ති කාමරයේ ප්‍රදර්ශනය කර ඇති ආදර්ශ මඟින් පොත් පිටකවරයක මූලික ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබාගන්න.
- ඔබ කැමති ප්‍රමාණයේ පොත් පිටකවරයක් සඳහා ඔබට සපයනක ලද ඩ්‍රොවින් කඩදාසිය මත ළමා පොත් පිටකවරයේ මුල් කවරය, පොතේ සනකම හා පසුකවරය අඩිකෝදුව හා පැන්සලය භාවිතයෙන් සැලසුම් කරන්න.
- පොත් කවරය සඳහා තෝරාගත් ප්‍රමාණයේම වෙනත් කඩදාසියක පිටකවරය සඳහා සුදුසු චිත්‍රයේ දළ රේඛා සටහන්, ගැළපෙන නම හා කර්තෘ නාමය ඇතුලු වෙනත් අක්ෂර යොදා කටු සටහන සැලසුම් කරන්න.
- පිට කවරයේ සැලසුම සහිත ඩ්‍රොවින් කඩදාසිය මත තෝරාගත් වර්ණ කිහිපයක් (පැස්ටල් හෝ දියසායම්) සනව හෝ දියර වැනි ආකාරයට සකස් කර කැමති ආකාරයකට නිදහස් ලෙස ආලේප කර වියළෙන්නට තබන්න.

- ඔබට ලැබී ඇති අර්තාපල්, කුරුම්බැට්ටි, ස්වභාවික ශාක පත්‍ර වැනි සපයාගත් ස්වභාවික ද්‍රව්‍ය අච්චුවක් සඳහා භාවිත කරන්න.
- පේපර් කටර් එක ආධාරයෙන් මතුපිට සුමට කර මෝස්තර නිර්මාණය කපා ඉවත්කර සුදුසු අයුරින් අච්චුවක් සකස් කරගන්න.
- පොත් කවරය සඳහා මුලින් යොදන ලද පසුබිම් වර්ණය හා ගැළපෙන ඝන දියසායම් අවශ්‍ය පමණ භාජනයකට දමන්න.
- සකස් කරගත් සමතල අච්චුවේ සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් සායම් තවරන්න.
- කලින් සැලසුම් කරගත් ආදර්ශ සටහනට ගැළපෙන ලෙස මෝස්තරය සකස් කර මුද්‍රණය කරගන්න.
- මුද්‍රණය කරන ලද මෝස්තරය වියළුණ පසු පොත් නාමය හා කවරයට අදාළ අනෙකුත් අක්ෂර හා ආධාරක රේඛා ටිෂූ කඩදාසියක ආධාරයෙන් පිටපත් කරන්න.
- නොම්මර 00-01 පින්සලය රූගෙන ගැළපෙන වර්ණයකින් අක්ෂර හා අනෙකුත් රේඛා සැරසිලි වර්ණ කරන්න.
- පොත් පිටකවරය කැපෙන මායිම් හා නැමෙන ස්ථාන කළු ඉරිවලින් ලකුණු කරන්න.
- නිමකරන ලද පොත් පිටකවරය පන්තියට ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරන්න.

පහත මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.

4.1.2 පොත් සලකුණක් නිර්මාණය කරමු. - කාලච්ඡේද 04

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.2** : **ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය භාවිත කරයි.**

**ක්‍රියාකාරකම 4.2.1** : **ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීම.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල** :

- ආරාධනා පත්‍රයක භාවිත අවස්ථා හඳුනා ගනියි.
- අච්චු භාවිත කිරීමෙන් සන්නිවේදන අවශ්‍යතාවක දී ලැබෙන වාසි පිළිබඳ ව අවබෝධ කරගනියි.
- ග්‍රැෆික් චිත්‍ර නිර්මාණකරණයේ දී සැලකිලිමත් විය යුතු සුවිශේෂී අංග පිළිබඳ දැනුවත් ව කටයුතු කරයි.
- උපකරණ නිවැරදි ව භාවිත කරයි.
- සිදුරු තහඩු මුද්‍රණය මඟින් ආරාධනා පත්‍රයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.2.1.1 ට අදාළ ගවේෂණ කාර්ය /උපදෙස් පත්‍රිකා
- බ්‍රිස්ටල් බෝර්ඩ් හා සුදුසු ඝනකම් කඩදාසි
- පෝස්ටර් සායම්, ෆැබ්රික් සායම්
- කෙඳි සිරස්ව ඇති දත් බුරුසුවක්, හිස පීරන පනාවක්
- පේපර් කටර්, ඇමුණුම් කටු, පින්සල් හා ජ්‍යාමිතික උපකරණ
- විවිධ ආරාධනා පත් කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පියවර 4.2.1.1** :

- සපයාගත් විවධ උත්සව අවස්ථාවන් සඳහා නිර්මාණය කළ ආරාධනා පත්‍ර කිහිපයක් පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම ආරාධනා පත්‍ර පිළිබඳ සිසුන්ගේ අදහස් විමසමින් විවිධ මුද්‍රණ ක්‍රම පිළිබඳ සරල පැහැදිලි කිරීමක් කරන්න.
- සිදුරු තහඩු මුද්‍රණය තවත් එක් සරල මුද්‍රණ අවස්ථාවක් බව සඳහන් කරන්න.
- දළ රේඛා සටහනකින් අරඹා සිදුරු තහඩු මුද්‍රණයෙන් ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීම සඳහා සැලසුම් කරන ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 4.2.1.2** :

- ඇමුණුම 4.2.1.1 ට අදාළ ගවේෂණ කාර්ය /උපදෙස් පත්‍රිකාවේ පිටපත් සිසුන් අතර බෙදා දෙන්න.
- ගුණාත්මක යෙදවුම් සඳහා ලබාගත් අවශ්‍ය ද්‍රව්‍ය සිසුන් වෙත ලබාදෙන්න.
- ගවේෂණ /කාර්ය පත්‍රිකාව අනුව ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරවන්න.
- ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව ස්වයං අධ්‍යයනයකින් අවබෝධ කරගත නොහැකි අවස්ථාවක දී සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් සිසුනට ක්‍රියාවලිය පැහැදිලි කර දෙන්න.

(මිනිත්තු 90 යි.)

**පියවර 4.2.1.3** :
- සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කරවන්න.
- එම නිර්මාණ පිළිබඳ සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තව දුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා සිසුන් සමඟ සාකච්ඡා කරමින් අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- සිදුරු තහඩුවක් මුද්‍රණය සඳහා සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු අවස්ථා සහ මුද්‍රණ ක්‍රියාවලිය තුළදී සිදුවිය හැකි තාක්ෂණික ගැටලු පිළිබඳ තවදුරටත් දැනුවත් කරන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍ර මුද්‍රණය කළ හැකි මුද්‍රණ ක්‍රම හඳුනාගැනීම
- ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීමේ දී ඉදිරිපත් කරන හැඩතල, සංකේත, අත්සන් වැනි දේ අදාළ කරුණ සඳහා උචිත වීම වඩා වැදගත් වන බව පිළිගැනීම
- සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමයෙන් ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීම
- (සිදුරු තහඩු මුද්‍රණයේ දී) නිවැරදි උපකරණ භාවිතය කිරීම
- නිර්මාණාත්මක ආරාධනා පත්‍ර සකස් කිරීම

**ඇමුණුම 4.2.1.1**

## ගවේෂණ / කාර්ය උපදෙස් පත්‍රිකාව

- ගුරුතුමා ඉදිරිපත් කරන ලද විවිධ ආරාධනා පත්‍ර හොඳින් නිරීක්ෂණය කරන්න.
- අවශ්‍යතාවට ගැළපෙන ලෙස රූප සටහන්, සංකේත හා අක්ෂර යොදා ඇති ආකාරය අවබෝධ කරගන්න.
- සනකම් ඩ්‍රොයින් කඩදාසිය මත ඔබ නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන ආරාධනා පත්‍රයේ ඉදිරිපස හා පසුපස ද සටහන් කර සුදුසු ප්‍රමාණයට සීමා/රේඛා ඇඳ සැලසුම් කරන්න.
- එම නිර්මාණයට බ්‍රිස්ටල් බෝර්ඩ් එක හා දළ රේඛා සටහන් ඇඳීමට භාවිත කරන කඩදාසිය මත සීමා/රේඛා ඇඳ සලකුණු කරන්න.
- ක්‍රීඩා උත්සවයකට ගැළපෙන පරිදි, රූප හැඩතල, සංකේත හා වැකි යොදා දළ රේඛා චිත්‍රය අඳින්න.
- බ්‍රිස්ටල් බෝර්ඩ් එක කපා ඉවත් කර එය මත දළ රේඛා සටහන තබා අවශ්‍ය රූප හා සංකේත පිටපත් කරන්න. (සිදුරු තහඩු මුද්‍රණය සඳහා සටහන් අඳින විට හැඩතල වෙන් නොවන සේ කපා ගැනීමට හැකිවන පරිදි ආධාරක තීරු සහිතව රූප සටහන් අඳින්න.

- ආධාරක තීරු ඉතිරි වන සේ සිදුරු තහඩුව කඩදාසි කපනයක් ආධාරයෙන් කපා ගන්න.
- සකස් කර ගත් සිදුරු තහඩුව ආරාධනා පත්‍රය මත තබා නොසෙල්වන සේ ක්ලිප් කටු ආධාරයෙන් සවි කර ගන්න.
- සපයාගත් වර්ණ පැතලි භාජනයකට දමා මුද්‍රණය සඳහා සුදුසු වන පරිදි සායම් මිශ්‍රණය සකස් කරගන්න.
- දත් මදින බුරුසුව සායම් මිශ්‍රණයේ තවරා පනාව උපයෝගි කරගනිමින් සිදුරු තහඩුව මත විසුරුවන්න.
- සායම් මිශ්‍රණය හොඳින් ආලේප වූ පසු ප්‍රවේශමින් සිදුරු තහඩුව ඉවත් කරන්න.
- මුද්‍රණය වියළුන පසු ආරාධනා පත්‍රය මත දළ රේඛා සටහන් තබා අක්ෂර හා අවශ්‍ය රේඛා සටහන් කරගන්න.
- මුද්‍රණයට ගැළපෙන කැපී පෙනෙන වර්ණයක් පින්සලක් භාවිත කර අදාළ අක්ෂර වටා රේඛා සටහන් අඳින්න.
- නිමකරන ලද ආරාධනා පත්‍රය සනකම් චිත්‍ර කඩදාසියෙන් කපා වෙන්කර ගන්න.
- ඔබේ නිර්මාණය පන්තියේ ප්‍රදර්ශනය කිරීම සඳහා සූදානම් කරන්න.

පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.

4.2.2 ආගමික උත්සවයක් පදනම් කරගෙන සුබ පැතුම්පතක් නිර්මාණය කරන්න - කාලච්ඡේද 04

**නිපුණතාව 5.0** : **විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 5.1** : **ඇඹීමේ හා එකලස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් මූර්ති නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 5.1.1** : **''ජ්‍යාමිතික හැඩ හදමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **03 යි.**

**ඉගෙනුම් පල** :
- මැටි මාධ්‍ය භාවිතය සහ පදම් කිරීම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.
- මැටි මාධ්‍යයෙන් සරල ජ්‍යාමිතික හැඩ නිර්මාණය කරයි.
- උපකරණ විධිමත්ව භාවිතය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.
- සාදාගත් ජ්‍යාමිතික හැඩ එකතුවෙන් මනා සම්පිණ්ඩනයක් කර පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම්** :
- කළුලෑල්ල, හුණු, ආදර්ශ ජ්‍යාමිතික හැඩතල, පදම් කළ මැටි, මේසය මත තබාගත හැකි ආධාරකයක්, කියත්පටි, කුඩා පිහියක්, මැටි පදම් කර ගැනීමට උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 5.1.1.1** :
- සපයාගත් ජ්‍යාමිතික හැඩ සිසුන්ට ප්‍රදර්ශනය වන පරිදි තබන්න.
- කලුලෑල්ල/සුදුලෑල්ල භාවිත කොට අවශ්‍ය හැඩ ඇඳ දක්වන්න.
- ජ්‍යාමිතික හැඩ සම්බන්ධව සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

(මිනිත්තු 15 යි.)

**පියවර 5.1.1.2** :
- සපයාගත් ලෑලි කැබැල්ල මේසය මත තබා පදම් කළ මැටි ඒ මත තබා ගැනීමට උපදෙස් දෙන්න.
- උපකරණ භාවිත කොට, ගෝලය, ඝනකය, ඝනකාභය, සිලින්ඩරය යන හැඩ සාදා ගැනීමට උදව් වන්න.
- උපකරණ භාවිතයට උපදෙස් දෙන්න.
- සම්පිණ්ඩනය කර සැකසූ රූප පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

**පියවර 5.1.1.3** :
- නිර්මාණ සුදුසු ස්ථානයක ප්‍රදර්ශනයට තබන්න.
- සිය නිර්මාණ සම්බන්ධ ව ස්වයං ඇගයීමකට අවස්ථාව දෙන්න.
- නිර්මාණ පිළිබඳ ව සංවර්ධනාත්මක අදහස් හා යෝජනා පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- මැටි මාධ්‍ය විවිධතා අවබෝධයෙන් හැඳින්වීම
- මැටි මාධ්‍ය භාවිතයෙන් පහසුවෙන් ජ්‍යාමිතික හැඩ නිර්මාණය කළ හැකි බව පිළිගැනීම
- සරල ජ්‍යාමිතික හැඩ නිර්මාණය කිරීම
- නිර්මාණය කරගත් හැඩ එකලස්කර සම්පිණ්ඩනය කිරීම
- විධිමත් ව උපකරණ භාවිත පිළිබඳ කුසලතාව ලැබීම

**නිපුණතාව 5.0 :** **විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 5.1 :** **ඇඹීමේ හා එකලස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් මූර්ති නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 5.1.2 :** **විවිධ මාධ්‍ය හෝ ද්‍රව්‍ය නිශ්චිත හැඩයකට අනුව සම්බන්ධකර මූර්ති නිර්මාණය කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03 යි.

**ඉගෙනුම් පල :**
- විවිධ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණ කරයි.
- මාධ්‍යවල විවිධතාවන් සම්බන්ධ ගුණයක් නිර්මාණයකට ගැළපෙන හා නොගැළපෙන බව අවබෝධයෙන් නිර්මාණය කරයි.
- එකලස් කිරීමේ දී මතුවන චමත්කාරය පිළිබඳ ව අවබෝධයෙන් වැඩ කරයි.
- උපකරණ භාවිතය සහ ඒ සම්බන්ධ අවබෝධයෙන් නිර්මාණකරණයෙහි යෙදෙයි.
- වර්ණ කිරීමේ විවිධතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.
- අන් නිර්මාණ අගයයි /රසවිඳියි.

**ගුණාත්මක යෙදවුම් :**
- ආදර්ශ පින්තූර
- ආදර්ශ නිර්මාණයක්, ඉවතලන ප්ලාස්ටික්, තහඩු ලී, ලෑලි පටි ගම් වර්ග, කඩදාසි, කාඩ්බෝඩ් පැන්සල්, සායම්, පින්සල්, ගිනිපෙට්ටිය, ඉටිපන්දම, කම්බි කටර් අඬුව මිටිය, ඇණ, කතුර, පිහිය, කළුලෑල්ල, හුණු (White Board/ Green Board)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 5.1.2.1 :**
- ආදර්ශ පින්තූර හෝ ආදර්ශ මූර්ති පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඒ සම්බන්ධ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ද්‍රව්‍ය එකලස් කිරීම නිර්මාණයට ගැළපීම, පහසුව මත සිදුවන බව සිසුන් දැනුවත් කරන්න.
- උපකරණ භාවිතයෙන් නිර්මාණය පහසු කරන ආකාරය පැහැදිලි කරන්න.

(මිනිත්තු 05 යි.)

**පියවර 5.1.2.2 :**
- දළ සටහන් ඇඳීමට අවශ්‍ය කඩදාසි ලබාදෙන්න.
- කළ යුතු කාර්ය පැහැදිලි කරන්න.
- දළ සටහන් ඇඳීමට මඟ පෙන්වන්න.
- එකතු කරගත් ද්‍රව්‍ය ඇඳගත් ආසන්න හැඩයට අලවා ගන්න. කම්බි ආධාරයෙන් බැඳ ගන්න.
- අවශ්‍ය නම් ලෑලි කැබැල්ලකින් පාදමක් සකසා ගන්න.
- ගැළපෙන පරිදි වර්ණ ගන්වා ගැනීමට උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 100 යි.)

**පියවර 5.1.2.3** :
- සිසුන්ගේ නිර්මාණ පන්ති කාමරය තුළ සකස් කරගත් ගැළපෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන්න.
- තම නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- සියලු නිර්මාණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරමින් අදහස් හුවමාරු කරන්න.

(මිනිත්තු 15)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- එකලස් කිරීම කුමක්දැයි විස්තර කිරීම
- විවිධ මාධ්‍ය/ද්‍රව්‍ය එකලස් කිරීමෙන් මූර්තියක නිර්මාණය කළ හැකි බව පිළිගැනීම
- විවිධ හැඩැති කොටස් ඇලවීම හෝ එකලස් කරගැනීම මගින් වෙනස් ස්වරූපයක හැඩයක නිර්මාණයක් කර වර්ණ ගැන්වීම
- නිවැරදිව උපකරණ භාවිත කිරීම
- අනෙක් සිසුන්ගේ නිර්මාණ ඇගයීම

**පහත මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

5.1.3 මානව රූප හා සත්ව රූප උන්නතව නිර්මාණය කරමු. - කාලච්ඡේද 04 යි

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදනයට ලක්කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : තෝරා ගත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවන් හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.1.1 : ''වෙසක් උත්සවය ආශ්‍රිත කලා අංග රස විඳිමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි.

ඉගෙනුම් පල :

- වෙසක් උත්සවය හා සම්බන්ධ සංස්කෘතික අංග නම් කරයි.
- වෙසක් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග විස්තර කරයි.
- ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්ට මුල් තැන දී කටයුතු කරන බෞද්ධාගමික උත්සවයක් බව පවසයි.
- වෙසක් උත්සවය පදනම් කරගෙන සිදුකරන ක්‍රියාකාරකම් මගින් මානව සහයෝගිතාව හා එක්සත්කම ඇතිවන බව පවසයි.

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 6.1.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- වෙසක් කාඩ්පත්, බුදුරජාණන් වහන්සේගේ තෙමගුල සිහිගන්වන පින්තූර, වෙසක් කූඩු, තොරණ පිංතූර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 6.1.1.1 :

- අලංකාර වෙසක් පහන් කූඩුවක් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- වෙසක් උත්සවය සඳහා යොදාගන්නා නිර්මාණ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි.)

පියවර 6.1.1.2 :

- ඇමුණුම 6.1.1.1 ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- ඇමුණුම 6.1.1.2 ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- කියවීම් පත්‍රිකාවේ ඇතුළත් කරුණු සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අදාළ ක්‍රියාකාරකම්හි නිරතවීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි.)

පියවර 6.1.1.3 :

- සිසුන්ගේ පිළිතුරු පත් පන්තියට ඉදිරිපත් කරවන්න.
- සපයන ලද පිළිතුරු පත් පිළිබඳ ඇගයීමට ලක්කරන්න.
- ආවරණය නොවූ විෂය කොටස් මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.1.1 හා ඇමුණුම 6.1.1.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල නම් කිරීම
- වෙසක් උත්සවය හා සංස්කෘතික අංග විස්තර කිරීම
- වෙසක් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග සඳහා භාවිත අමුද්‍රව්‍ය නම් කිරීම
- බෞද්ධ කොඩියේ දක්නට ලැබෙන වර්ණ නම් කිරීම
- වෙසක් උත්සවය හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරතවීමෙන් මානව සහයෝගිතාව හා එක්සත්කම ඇතිවන බව ප්‍රකාශ කිරීම

**ඇමුණුම 6.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. වෙසක් උත්සවය වැදගත් වන්නේ ඇයි ?
2. වෙසක් උත්සවය විචිත්‍රවත් කරන සැරසිලි තුනක් නම් කරන්න.
3. වෙසක් සැරසිලි සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය කිහිපයක් නම් කරන්න.
4. වෙසක් උත්සවයේ දී බෞද්ධයන් අනුගමනය කරන පූජා විධි දෙක මොනවාද?
5. වෙසක් උත්සවයේ දී බෞද්ධයන් තුළ වර්ධනය වන ආකල්ප මොනවාද ?
6. වෙසක්පතක් ඇඳ වර්ණවත් කරන්න.

ඇමුණුම 6.1.1.2

# කියවීම් පත්‍රිකාව

- වෙසක් දිනය ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පූජනීය වූ උතුම් වූ දිනයයි.
- සිදුහත් කුමරුන්ගේ උත්පත්තිය, බුද්ධත්වයට පත්වීම හා පිරිනිවන් පෑම යන තෙමඟුල සිහිගන්වමින් මෙම උත්සවය සිදු කරයි.
- වෙසක් උත්සවය අරභයා සිදුකරනු ලබන පිංකම් මගින් මානව සහයෝගිතාවය හා එක්සත්කම වැනි ආකල්ප වර්ධනය වේ.
- වෙසක් උත්සවයේ දී ආමිස මෙන් ම ප්‍රතිපත්ති පූජාවට ද ප්‍රමුඛතාව ලැබේ.
- බෞද්ධ පූජනීය ස්ථාන මුල් කොට ගෙන වෙසක් උත්සවය සමරනු ලැබේ.
- බොදු බැතිමතුන් විසින් සිල් සමාදන්වීම, බෝධි පූජා, දන්සැල් හා ශබ්ද පූජා පැවැත්වීම මෙම උත්සවයේ පවත්නා සුවිශේෂී අංග වේ.
- ගමේ පන්සල ප්‍රධාන කොටගෙන වෙසක් උත්සවය අලංකාරව පවත්වනු ලැබේ.
- තොරණ, පහන් කූඩු, සුභ පැතුම්පත්, පහන් වැටි, බල්බ් වැල්, කොඩි ආදී නිර්මාණ අංග තුළින් මෙහි අසිරිමත් බව වැඩි වේ.
- වෙසක් නිර්මාණ කිරීමේ දී ටිෂූ කඩදාසි, ගොක් කොළ, වර්ණ කඩදාසි, ඉරටු, පොල් කටු ආදී විවිධ ද්‍රව්‍යය භාවිත කරයි.
- මිදුලේ විවිධ හැඩතල ඇඳ ඒ අනුව පහන් තබා දැල්වීමෙන් හා සකස්කරන පහන් වැටි ආශ්‍රිත අලංකාර පහන් සැරසිලි නිර්මාණ ද කරනු ලැබේ.
- කෙසෙල් කොට ප්‍රයෝජනයට ගනිමින් ඒවායේ අලංකාර හැඩ යොදා වෙසක් පහන් ඒ මත තබා දැල්වීමෙන් අලංකාර සැරසිලි අංග නිර්මාණය කර ගනියි.
- වෙල් කඳුරු ගෙඩි සහ නාවා ගස්වල ගෙඩි ආදිය ද පහන් සඳහා විකල්ප ක්‍රම වශයෙන් භාවිත කරයි.
- වෙසක් උත්සවය විවිධ ජාතීන්ගේ නිර්මාණ රසඥතා වර්ධනය කර ගැනීම සඳහා පාදක වේ.

**නිපුණතාව 6.0 :** **ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කෘතී, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසස්වාදනයට ලක්කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1 :** **තෝරාගත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවන් හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.2 :** **''තෛපොංගල් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග හඳුනා ගනිමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව :** **01 යි.**

**ඉගෙනුම් පල :**

- තෛපොංගල් උත්සවය හින්දු භක්තිකයන් ගේ ප්‍රධාන උත්සවයක් බව ප්‍රකාශ කරයි.
- තෛපොංගල් උත්සවයේ දී භාවිත වන ආසිරිපත්, කෝලම් රටා, තොරණ නිර්මාණ, පහන් දැල්වීම හා පුන්කලස් වැනි විවිධ සැරසිලි අංග විස්තර කරයි.
- සැරසිලි අංග සඳහා භාවිත අමුද්‍රව්‍ය නම් කරයි.
- හින්දු සැරසිලි නිර්මාණ විවිධ උත්සව අවස්ථා සඳහා ගත හැකි අයුරු සොයා බලයි.
- අන්‍ය ආගමික චාරිත්‍රවලට ගරු කිරීමෙන් එකිනෙකා අතර සුහදත්වය වර්ධනය කර ගත හැකි බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම් :**

- තෛපොංගල් උත්සවය පිළිබඳ තොරතුරු ඇතුළත් චිත්‍ර, ඡායාරූප තෛපොංගල් ආසිරි පත්
- ඇමුණුම 6.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- ගොක්කොළයකින් කරන ලද නිර්මාණයක්
  (උදා:- නෙළුම් මලක්, තරුවක්, නයෙක්)
- ගොක්කොළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.2.1 :**

- තෛපොංගල් උත්සවය පිළිබඳ තොරතුරු ඇතුළත් චිත්‍ර, පින්තූර හා ආසිරිපත් පන්තියේ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- තෛපොංගල් උත්සවය සම්බන්ධ රූප සටහන් හා ආසිරිපත් නිරීක්ෂණයට ලබාදෙන්න.

(මිනිත්තු 08 යි.)

**පියවර 6.1.2.2 :**

- 6.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න
- 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව අධ්‍යයනය සිසුන්ට අවස්ථාව

සලසාදෙන්න.

- තෛපොංගල් උත්සවය පිළිබඳ සාකච්ඡාවක නිරතවන්න.
- කියවීම් පත්‍රිකාව පදනම් කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට මග පෙන්වන්න.
- තෛපොංගල් උත්සවයට හා අදාළ කලා අංග චිත්‍රණය කිරීමට මග පෙන්වන්න

(මිනිත්තු 20 යි.)

**පියවර 6.1.2.3** :

- සිසුන්ගේ ඇගයීම් පන්තියට ඉදිරිපත් කරවන්න.
- සපයන ලද පිළිතුරු පත් ඇගයීමට ලක්කරන්න.
- ආවරණය නොවූ විෂය කොටස් මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 12 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.2.1 හා ඇමුණුම 6.1.2.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- හින්දු භක්තිකයින් විසින් ජනවාරි මාසයේ පවත්වනු ලබන ආගමික උත්සවය නම් කිරීම
- තෛපොංගල් උත්සවයේ දී දැකිය හැකි නිර්මාණ නම් කිරීම
- ඒ සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය නම් කිරීම
- තෛපොංගල් උත්සවයේ දී ගෙබිම අලංකාර කරන නිර්මාණ රටා හඳුන්වා ඒවායේ ඇති කලාත්මක ලක්ෂණ සඳහන් කිරීම

**ඇමුණුම 6.1.2.1**

## කාර්ය පත්‍රිකාව

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. තෛපොංගල් උත්සවය වැදගත් වන්නේ ඇයි ?
2. තෛපොංගල් උත්සවය විචිත්‍රවත් කරන සැරසිලි හඳුන්වන්න.
3. තෛපොංගල් සැරසිලි සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය කිහිපයක් නම් කරන්න.
4. මෙම උත්සවයේ දී හින්දූන් විසින් අනුගමනය කරන පූජා විධි මොනවාද?
5. තෛපොංගල් උත්සවයේ දී හින්දූන් තුළ වර්ධනය වන ආකල්ප මොනවාද ?
6. තෛපොංගල් උත්සවයේදී ගෙබිම අලංකාර කරන කෝලම් රටාවක් ඇඳ වර්ණවත් කරන්න.

ඇමුණුම 6.1.1.1

# කියවීම් පත්‍රිකාව

- තෛපොංගල් උත්සවය හින්දු භක්තිකයන්ගේ ප්‍රධාන ආගමික උත්සවයකි.
- දමිළ අවුරුදු ක්‍රමය අනුව වසරේ පළමුවන මාසය සඳහා ''තෛ'' යන නාමය භාවිත වේ.
- එය ජනවාරි ''තෛ'' මාසයේ  මාසයේ 14 හෝ 15 දින පැවැත්වේ.
- අලුත් සහල් අලුත් මැටි මුට්ටියක දමා පිළියෙල කර කිරි ඉතිරවීම "පොංගල්" යනුවෙන් හැඳින්වේ.
- උත්සවය පැවැත්වීමට පෙර ගෙබිම පිරිසිදු කොට ප්‍රධාන දොරටුවට බද්ධවන සේ හිටවන ලද කෙසෙල් ගස් දෙකකින් තොරණක් සාදනු ලබයි.
- පිරිසිදු කරගත් ගෙබිම මැද කහ කුඩු සහ සහල් පිටිවලින් කෝලම් රටා නිර්මාණය කරයි.
- එකී කෝලම් රටාවේ මැද ලිපක් බැඳ කිරිබත් පිස පුද පූජාවන් කරනු ලබයි.
- කෝලම් රටාව මැද පූර්ණ කුම්භ සාදා පහනක් තබා කිරිබත් පිළියෙල කොට හිරු නැග එත්ම කිරි, උක්, හකුරු, පලතුරු සහ වී තබා හිරු දෙවියන්ට පූජා කරනු ලැබේ.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසස්වාදනයට ලක්කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **තෝරා ගත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවන්හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.3** : ''දානය, දයාව පිරි රාමසාන් උත්සවය''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි.

**ඉගෙනුම් පල** :

- රාමසාන් උත්සවය සමරන ජන වර්ගය නම් කරයි.
- එම උත්සවය පවත්වන කාලය පවසයි.
- රාමසාන් උත්සවයේ අරමුණු පැහැදිලි කරයි.
- උත්සව සමයේ ඉටුකරන ප්‍රධාන කාර්ය විස්තර කරයි.
- රාමසාන් උත්සව සමයේ දැකගත හැකි සත් ක්‍රියා පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- රාමසාන් උත්සවය පිළිබඳ පින්තූර හා පුවත්පත් ලිපි.
- ඇමුණුම 6.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.3.1** :

- රාමසාන් උත්සවය පිළිබඳ පින්තූර හා පුවත්පත් ලිපි පංතිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- රාමසාන් උත්සවය පිළිබඳ තොරතුරු සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 08 යි.)

**පියවර 6.1.3.2** :

- ඇමුණුම 6.1.3.2 ට ඇතුළත් කියවීම පත්‍රිකාව කියවීමට අවස්ථාව දෙන්න
- ඒ පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡාවක නිරතවන්න.
- ඇමුණුම 6.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකමෙහි යෙදීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි.)

**පියවර 6.1.3.3** :

- සිසුන්ගේ පිළිතුරු පත් පන්තියට ඉදිරිපත් කරවන්න.
- සපයන ලද පිළිතුරු පත් පිළිබඳ ඇගයීමට ලක්කරන්න.
- ආවරණය නොවූ විෂය කොටස් මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 12 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.3.1 හා ඇමුණුම 6.1.3.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- රාමසාන් උත්සවයේ අරමුණ පැහැදිලි කිරීම
- උත්සව සමයේ ඉටුවන ප්‍රධාන කාර්ය විස්තර කිරීම
- උත්සව සමයේ දැකගත හැකි යහපත් ක්‍රියාකාරකම් විස්තර කිරීම

**ඇමුණුම 6.1.3.1**

## කාර්ය පත්‍රිකාව

1. ඔබට ලබාදී ඇති කියවීම් පත්‍රිකාව නිරීක්ෂණය කරන්න.
2 සපයා ඇති පින්තූර හා පුවත්පත් ලිපි නිරීක්ෂණය කරන්න.
3. ගුරුතුමා ලබාදෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
4. ගුරුතුමා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සාකච්ඡා කිරීමේදී ඔබේ අදහස් දක්වමින් සාකච්ඡාවට සහභාගිවන්න.

# කියවීම් පත්‍රිකාව

- රාමසාන් උත්සවය (**ඊදුල් ෆිත්ර්**)ඉස්ලාම් ප්‍රජාවට සුවිශේෂ වූ උත්සවයකි.
- ඉස්ලාමීය දින දර්ශනයේ නව වන මාසය වන රමලාන් මාසයේ මුල් සඳ දුටු තැන් සිට දසවන මාසය වන ෂව්වාල් මාසයේ මුල් සඳ දක්වා දින 29 හෝ 30 ක් උපවාස කාලයකින් පසුව රාමසාන් උත්සවය එළඹේ.
- මෙකී උපවාස කාලය තුළ ලොව පුරා විසිරී සිටින මුස්ලිම් බැතිමත්හු ඉතා අධික භක්තියෙන් යුතු ව උපවාසයේ නියැලෙති.
- මෙකී උපවාසය "සව්ම්" යන අරාබි වහරෙන් හඳුන්වනු ලැබේ.
- උපවාසයේ දී අලුයම නැමදුම් (සලාත්) වේලාව ආරම්භ වීමට සුළු මොහොතකට පෙර සිට හිරු බැසයන කාලය වන තුරු කිසිදු ආහාරපාන ගැනීමක්, උපවාසය කඩවන දෙයක් කිරීමක් සිදු නොවේ.
- සව්ම් සමාදන් (උපවාසයේ යෙදීම) මගින් කුසගින්නේ කුරිරු බව අවබෝධ වීම නිසා දිළින්දන්ට පිහිටවීමේ ආකල්ප ඇතිවනවා පමණක් නොව ඔවුහු එය ක්‍රියාවට නැංවීමට ද පෙළඹෙති.
- එහෙයින් මෙම කාලයේ බහුල වශයෙන් "(Z)සකාත් යන අනිවාර්ය දානය ද "සදකා" යන අනිවාර්ය නොවන දානය ද මුස්ලිම්වරු විසින් දෙනු ලැබේ.
- "සව්ම්" නොහොත් උපවාසයේ යෙදීමේ දී සිත දමනය කර ජීවත් වීමට පුහුණුවක් ද ඉවසීමෙන් ජීවත් වීමේ හැකියාව ද ලැබේ. එමෙන් ම මෙමගින් මනුෂ්‍යා තුළ යහපත් ගුණදහම් වර්ධනය වන අතර යහපත් විනයක් පවත්වා ගැනීමට ද පුහුණුවක් ලැබේ.
- වයස අවු 10 ට වැඩි සියලුම් මුස්ලිම් පිරිමින් හා ස්ත්‍රීන්ට උපවාසය රැකීම අනිවාර්ය වේ. එහෙත් කුඩා දරුවන්, රෝගීන්, වයෝවෘධයන්, ගැබිනි මව්වරුන් හා කිරිදෙන මව්වරුන් සඳහා සහන/ විකල්ප ඇත.
- මුස්ලිම්වරු උපවාසයේ යෙදෙන කාලයේ වැඩි වශයෙන් යාඥා කරමින් (විශේෂයෙන්ම රාත්‍රී කාලයේ) හා ශුද්ධ වූ 'කුර්ආනය' පාරායනයේ (කියවමින්) පසුවෙති. 'අල්ලාහ්' දෙවියන්ගෙන් මේ සඳහා අධික ආනිශංස ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයයි.
- නව සඳ දැකීමෙන් පසු උපවාස කාලය අවසන් වේ.
- උපවාස කාලය අවසන් වීමත් සමඟ මස්ජිදයට (දේවස්ථානයට) ගොස් යාඥා කර රාමසාන් උත්සවය පැවැත්වීම මුස්ලිම් ජනතාවගේ ප්‍රධාන කාර්යයක් වෙති.
- රාමසාන් උත්සව දිනයේ කෙරෙන මහත් සත්ක්‍රියාවකි "සකාතුල් ෆිත්රා" නම් දානය දීම.
- පවුලේ සංඛ්‍යාව අනුව එක් අයෙකුට 2 kg බැගින් පස් දෙනෙකු සිටීනම් 10 kg දන් දිය යුතුයි.
- එම දානය දිය යුත්තේ පසුදා උදය නැමදුම අවසන් වීමට පෙරය.

**නිපුණතාව 6.0 :** **ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසස්වාදනයට ලක්කරමින් ස්වත්‍රන්ත නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1 :** **තෝරා ගත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවන් හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.4 :** ''නත්තල් උත්සවය හා බැඳි නිර්මාණ අගයමු.''

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01 යි.

**ඉගෙනුම් පල :**

- නත්තල් උත්සවය ලෝකවාසී ක්‍රිස්තියානි බැතිමතුන් ගේ වැදගත් ආගමික හා සංස්කෘතික උත්සවයක් බව පවසයි.
- නත්තල් උත්සවය විචිත්‍රවත් කරන සැරසිලි අංග නම් කරයි.
- නත්තල් උත්සවය සැමරීමේ දී සාමය, පරිත්‍යාගය ප්‍රධාන තැනක් ගන්නා බව පවසයි.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 6.1.4.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- නත්තල් සීයාගේ පින්තූරයක්
- නත්තල් සුබ පැතුම් පතක්
- ගව ලෙනක පින්තූරයක්
- නත්තල් ගසක පින්තූරයක්
- නත්තල් ගීත අඩංගු C D තැටි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.4.1 :**

- නත්තල් උත්සවය හා සම්බන්ධ ගීත ඇතුළත් CD තැටි භාවිත කරමින් ගීතයක කොටසක් සිසුනට අසන්නට සලස්වන්න. නැතිනම් ගුරුභවතා ගායනා කරන්න.
- නත්තල පිළිබඳ සපයාගත් පින්තූර පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- නත්තල උදාවන මාසය හා දිනය ගැන සාකච්ඡා කරන්න.
- නත්තල හා බැඳුණු කලා නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 08 යි.)

**පියවර 6.1.4.2 :**

- ඇමුණුම 6.1.4.1 ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- ඇමුණුම 6.1.4.2 ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- එම කරුණු සිසුන් සමග සාකච්ඡාවට ලක් කරන්න.
- අදාළ ක්‍රියාකාරකම්හි නිරතවීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි.)

**පියවර 6.1.4.3 :**

- අදාළ ප්‍රශ්න සඳහා සපයන ලද පිළිතුරු සිසුන්ගෙන් අහඹු ලෙස වාචිකව විමසන්න.

- සපයන ලද පිළිතුරු පිළිබඳ ඇගයීමට ලක්කරන්න.
- ආවරණය නොවූ විෂය කොටස් මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 12 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.4.1 හා ඇමුණුම 6.1.4.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- නත්තල සමරනු ලබන මාසය හා ආගමික ජන කොටස නම් කිරීම
- නත්තල් උත්සවය අලංකාර කරන සැරසිලි අංග විස්තර කිරීම
- සාමය හා පරිත්‍යාගශීලී බව නත්තල් උත්සවයෙන් ඉස්මතුවන බව ප්‍රකාශ කිරීම
- නත්තල් උත්සවයේ සැරසිලි වෙනත් ආගමික බැතිමතුන්ට පවා පොදුවේ රස විඳිය හැකි බව ප්‍රකාශ කිරීම
- අදාළ කලා අංගයක් ඇඳ වර්ණවත් කිරීම

**ඇමුණුම 6.1.4.1**

## කාර්ය පත්‍රිකාව

- **පහත සඳහන් ප්‍රශ්නවලට වාචිකව පිළිතුරු සපයන්න.**

1. නත්තල් උත්සවය සමරන ආගමික ජන කොටස හා මාසය නම් කරන්න.
2. නත්තල් උත්සවය හා බැඳුණු සැරසිලි අංග 4 ක් නම් කරන්න.
3. නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණ කුමක් ද ?
4. මෙම උත්සව කාලය තුළ සිදුවන යහපත් ක්‍රියා දෙකක් නම් කරන්න.
5. නත්තල් සැරසිලි සඳහා භාවිතවන අමුද්‍රව්‍ය 05ක් නම් කරන්න.
6. නත්තල් පතකට සුදුසු නිර්මාණයක් චිත්‍රණය කරන්න.

ඇමුණුම 6.1.4.2

# කියවීම් පත්‍රිකාව

- "නතාල" නැමති පෘතුගීසි වචනයෙන් බිඳී ආ නත්තල යන වචනයෙන් " උපත" යන අර්ථය ලබා දේ.
- ලතින් භාෂාවෙන් ද "නතාලිස්" යන්නෙහි අර්ථය "උපත " වේ.
- ලෝකය පුරා විසිරී සිටින ක්‍රිස්තියානි බැතිමත්හු ජේසු බිළිඳාගේ උපන් දින නත්තල ලෙසින් උත්සවාකාරයෙන් සමරති.
- ජේසුස් වහන්සේ යනු මනුෂ්‍යත්වය ලබාගත් දේව පුත්‍රයා වේ.
- නත්තල් උත්සවයේදී සමරනු ලබන්නේ ජේසුස් වහනසේගේ මෙම මනුෂ්‍යයකු ලෙස ඉපදීමයි.
- ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් ලෙස සලකනු ලැබේ.
- ජේසුතුමාගේ මව මරියතුමිය වන අතර උන්වහන්සේ සුරැකි පියා ජුසේතුමාණන් වේ.
- දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ ජේසු කුමරුන් උපන් බවට පිළිගැනේ.
- ජන සංගණනයකට සහභාගි වීම සඳහා "බෙත්ලෙහෙමට" පැමිණි අවස්ථාවේ ගවලෙනක් තුළ දී ජේසු බිළිඳාගේ උත්පත්තිය සිදු වූ බව පිළිගැනේ.
- ක්‍රිස්තුස් වහන්සේ විසින් සිදුකරනු ලැබූ දේශනා හා උන්වහන්සේගේ ප්‍රාතිහාර්යයක් ද සබත් දිනය නීති රීති කැඩීම හේතුකොටගෙන ජුදා නායකයින් උන්වහන්සේට විරුද්ධව නැගී සිටියෝ ය.
- එම හේතූන් මුලකොටගෙන උන්වහන්සේ කුරුසියේ එල්ලා මරා දැමූහ.
- සෑම වසරකම දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ ද දේවස්ථානයට රැස්වන කිතුනු බැතිමත්හු නත්තල හෙවත් ජේසු උපත උත්සවාකාරයෙන් පවත්වයි.
- එදින දුගී ජනතාවට ආහාරපාන, ඇඳුම් පැලඳුම් දීම මෙන් ම තෑගි බෝග බෙදා දීම ද සිදු කරනු ලබයි.
- කිතුනු බැතිමත්හු නත්තලට දින ගණනාවකට පෙර එම මංගල්‍යයට සැරසෙන අතර දේවස්ථානය හා නිවෙස් සැරසීම, ගවලෙන් සෑදීම හා නත්තල් ගස් අලංකරණය කිරීම ආදිය සිදුකරනු ලබති.
- එදින අලුත් ඇඳුම් පැලඳුම්වලින් සැරසීම මෙන් ම ප්‍රනීත ආහාරපාන පිළියෙල කිරීම ද ඔවුන්ගේ චාරිත්‍රයක් වේ.
- නත්තල් සුබපැතුම්පත් හුවමාරු කර ගැනීම විශේෂ සිද්ධියක්වන අතර නත්තල් සීයා කුඩා දරුවන්ගේ ප්‍රියජනක බලාපොරොත්තුවක් වේ.
- නත්තල් කැරොල් ගී, නත්තල් නාට්‍ය හා නත්තල ආශ්‍රිත චිත්‍රපට දර්ශන මෙම උත්සව කාලයේ දක්නට ලැබෙන විශේෂාංග වෙයි.
- දුප්පතුන් සඳහා දාන මාන දීම මෙන් ම කුඩා දරුවන් වෙනුවෙන් තෑගි බෝග හා ඇඳුම් පැලඳුම් බෙදා දීම ද නත්තල් දිනයේ දී පවත්නා සුවිශේෂ චාරිත්‍ර වේ.
- ජේසුස් වහන්සේගේ සාමයේ පණිවුඩය ලෝකවාසී සියලු දෙනා විසින් අගය කළ යුතු බව පිළිගැනීමට ලක් වෙයි.

නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 7.1 : විවිධ ආගමික බලපෑම් ඇසුරෙන් සම්භවය වූ කලා අංග අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 7.1.1 : ''බෞද්ධ ස්තූපයක මූලිකාංග හා ස්තූප වර්ග හඳුනා ගනිමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි

ඉගෙනුම් පල :
- ස්තූපයක රූප සටහන් ඇඳ කොටස් නම් කරයි.
- ගර්භයේ හැඩය අනුව ප්‍රධාන ස්තූප වර්ග හය හඳුනා ගනියි.
- ශ්‍රී ලංකාවේ ස්තූප පිහිටා ඇති ස්ථාන හා ඒවායේ හැඩ වගුගත කරයි.
- ස්තූපය බෞද්ධ කලා කෘතියක් ලෙස ක්‍රමිකව විකාශනය වීම පිළිබඳ ව වටහා ගනියි.
- ස්තූපයේ අංග නිවැරදිව නම් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- විවිධ හැඩයේ ගර්භ සහිත ස්තූපවල ඡායාරූප.
- ඇමුණුම 7.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 7.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 7.1.1.1 :
- ස්තූප සහිත ඡායාරූප පන්තියට පෙන්වන්න. දෘශ්‍යාධාර භාවිත කරන්න.
- ඒ සම්බන්ධ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ස්තූපය තුඹ, තුම්භ, ථූප, චෛත්‍ය යන නම්වලින් ද හඳුන්වන බව දැනුවත් කරන්න.
- ස්තූපය බෞද්ධ ස්මාරකයක් බවත්, බුදුරජාණන් වහන්සේගේ හා රහතන් වහන්සේලාගේ ශාරීරික හා පාරිභාරික ධාතූන් එහි තැන්පත් කර ඇති බවත් දැනුවත් කරන්න.

(මිනිත්තු 10 යි.)

පියවර 7.1.1.2 :
- ඇමුණුම් 7.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- ඇමුණුම 7.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා කියවීමට සලස්වන්න.
- චෛත්‍යයේ ක්‍රමික වර්ධනය හා එහි අංග පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ චෛත්‍ය නිර්මාණයට ඉන්දියාවේ සාංචි ස්තූපයේ ආභාසය ලැබී ඇති බව පහදන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් 03 කට බෙදන්න.
- කණ්ඩායමට අයත් තේමා යටතේ ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 7.1.1.3 : 

- එම කරුණු පෙළ ගස්වා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- එම අදහස් සිසුන් අතර හුවමාරු කර ගැනීමට සහාය වන්න.
- පාඩම සංවර්ධනයට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 40 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.1.1 හා ඇමුණුම 7.1.1.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ස්තූපයක් ඇඳ එහි මූලිකාංග නිවැරදිව නම් කිරීම
- ගර්භයේ හැඩය අනුව ප්‍රධාන ස්තූප වර්ග 6 නම් කිරීම
- බුදුරජාණන් වහන්සේගේ හා රහතන් වහන්සේලාගේ ශාරීරික හා පාරිභාරික ධාතු තැන්පත් කර බෞද්ධ ස්තූප නිර්මාණය කර ඇති ඇති බව පිළිගැනීම
- ශ්‍රී ලංකාවේ ඉපැරණි ස්තූප කිහිපයක් හා ඒවායේ හැඩ නිවැරදිව නම් කර වගුවක් සකස් කිරීම
- නායකත්වයට ගරු කරමින් කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම

**ඇමුණුම 7.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 7.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාවේ රූප සටහන් අධ්‍යයනය කරන්න.
- ඔබ කණ්ඩායමට අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

  I **කණ්ඩායම**

  **ක්‍රියාකාරකම** - ස්තූපයක රූප සටහනක් ඇඳ ප්‍රධාන කොටස් නම් කරන්න.

  II **කණ්ඩායම**

  **ක්‍රියාකාරකම** - ප්‍රධාන ස්තූප වර්ග 6 නම් කර ඒවායේ රූප සටහන් අඳින්න.

  III **කණ්ඩායම**

  **ක්‍රියාකාරකම** - ශ්‍රී ලංකාවේ ඉපැරණි චෛත්‍ය කිහිපයක් නම් කර ඒවා පිහිටි ස්ථාන හා හැඩ නම් කර වගුවක් සකස් කරන්න.

- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමාගේ/තුමියගේ සහය ලබාගන්න.

# කියවීම් පත්‍රිකාව


- බෞද්ධ ස්තූපය සිළුමිණ, කොත, කොත් කැරැල්ල, දේවතා කොටුව, හතරැස් කොටුව, ධාතු ගර්භය, පේසා වළලු, පාදම යන ප්‍රධාන ස්තූපාංගවලින් සමන්විත වේ.


- ශ්‍රී ලංකාවේ චෛත්‍යවල හතරැස් කොටුව යනුවෙන් හඳුන්වන අංගය ඉන්දියාවේ සාංචි ස්තූපයේ දී හර්මිකාව ලෙස හැඳින්වේ.

- ගර්භයේ හැඩය අනුව ප්‍රධාන චෛත්‍ය වර්ග 6 කි.

| | | | |
|---|---|---|---|
| 1. | ධාන්‍යාකාර චෛත්‍යය | - | වී ගොඩක හැඩය ඇති ස්තූපය |
| 2. | පද්මාකාර චෛත්‍යය | - | නෙළුම් මලක හැඩය ඇති ස්තූපය |
| 3. | ඝණ්ඨාකාර චෛත්‍යය | - | ඝණ්ඨාවක හැඩය ඇති ස්තූපය |
| 4. | බුබ්බුලාකාර/බුබුලාකාර චෛත්‍යය | - | දිය බුබුලක හැඩය ඇති ස්තූපය |
| 5. | ඝටාකාර චෛත්‍යය | - | කළයක් මුනින් අතට නැමූ හැඩය ඇති ස්තූපය |
| 6. | ආමලකාකාර/ආම්ලාකාර චෛත්‍යය | - | නෙල්ලි ගෙඩියක හැඩය ඇති ස්තූපය |


## ප්‍රධාන ස්තූපාංග








ඉන්දියාවේ සාංචි ස්තූපය


## ප්‍රධාන චෛ්‍ය වර්ග 6




ධාන්‍යාකාර චෛත්‍යය




පද්මාකාර චෛත්‍යය




ඝණ්ඨාකාර චෛත්‍යය



බුබ්බුලාකාර/බුබුලාකාර චෛත්‍යය



ඝටාකාර චෛත්‍ය චෛත්‍යය



ආමලකාකාර/ආම්ලාකාර චෛත්‍යය

**නිපුණතාව 7.0 :** **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1 :** **විවිධ ආගමික බලපෑම් ඇසුරින් සම්භවය වූ කලා අංග අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.2 :** **''හින්දු කෝවිලක මූලිකාංග හා එහි කලා නිර්මාණ හඳුනා ගනිමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව :** **02 යි.**

**ඉගෙනුම් පල :**
- හින්දු ආගමික ගෘහ නිර්මාණයක් ලෙස කෝවිල/දේවාලය හඳුනා ගනියි.
- හින්දු දේවාලය බිම් සැලැස්මේ ප්‍රධාන අංග නම් කරයි.
- හින්දු කෝවිලක පිවිසුම් දොරටුව හා සම්බන්ධ ප්‍රධාන ගෘහ නිර්මාණ අංගය වන 'ගෝපුර' හෙවත් 'ගෝපුරම්' හි කොටස් නම් කරයි.
- හින්දු ආගමික සංකේතයක් වන 'නන්දි ගවයාගේ' රුව කලාත්මක කෘතියක් බව ප්‍රකාශ කරයි.
- ආගමික සහජීවනයෙන් කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- හින්දු කෝවිලක් දැක්වෙන ඡායාරූප/රූපසටහන්
- හින්දු කෝවිල් දර්ශන ඇතුළත් වීඩියෝ පට, සීඩී.
- පරිගණක යන්ත්‍ර
- ඇමුණුම 7.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා පිටපත්
- ඇමුණුම 7.1.2.2 ට ඇතුළත් කියැවීම් පත්‍රිකා අවශ්‍ය පමණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.2.1 :**
- හින්දු කෝවිල නිරූපණය වන ඡායාරූප/රූප සටහන් පරිගණක යන්ත්‍ර උපයෝගි කරගෙන පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- හින්දු කෝවිලක බිම් සැලැස්මේ ප්‍රධාන අංග ලෙස මණ්ඩපය, අන්තරාලය හා ගර්භගෘහය හඳුන්වා දෙන්න.
- අලංකාරය ගැන වැඩි සැලකිල්ලක් දක්වා නිර්මාණය වී ඇති කෝවිල්වල බාහිර බිත්ති මත විමාන හැඩ හා ඒ තුළ මූර්ති නිර්මාණ දක්නට ලැබෙන බව පෙන්වා දෙන්න.
- දෙවොල මධ්‍යයේ වූ ශිඛරය මෙන් මූර්තිමය නිර්මාණ රැසකින් පිරීගිය පිවිසුම් දොරටුව ගෝපුර ලෙස හඳුන්වන බව වටහාදෙන්න.

(මිනිත්තු 40 යි.)

**පියවර 7.1.2.2 :**
- ඇමුණුම 7.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 7.12.2 ට ඇතුළත් කියැවීමේ පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා ක්‍රියාකාරකමේ යොදවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 7.1.2.3 :
- කණ්ඩායම සොයාගත් කරුණු ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ශ්‍රී ලංකාවේ ඉපැරණි හින්දු කෝවිල් වන යාපනයේ නල්ලූර් කෝවිල, ත්‍රිකුණාමලේ කෝනේශ්වරම් කෝවිල, හලාවත මුන්නේශ්වරම් කෝවිල පිළිබඳ දැනුවත් කරමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.2.1 හා ඇමුණුම 7.1.2.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- හින්දු කෝවිලක දළ රූප සටහනක් ඇඳ එහි ප්‍රධාන අංග නම් කිරීම
- හින්දු කෝවිලක බිම් සැලැස්මක් එහි ප්‍රධාන කොටස් නම් කිරීම
- හින්දු ආගම හා සම්බන්ධ උත්සව හා ඒවායේ කලාත්මක සහ සංස්කෘතිමය ලක්ෂණ හඳුනා ගැනීම
- ආගමික සහජීවනයෙන් හා සාමූහිකත්වයෙන් යුතු ව කටයුතු කිරීම

ඇමුණුම 7.1.2.1

## ගවේෂණ / කාර්යය උපදෙස් පත්‍රිකාව

- ඇමුණුම 7.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව නිරීක්ෂණය කරන්න.
- රූප සටහන් අධ්‍යයනය කර ඔබ කණ්ඩායමට අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

I **කණ්ඩායම**

**ක්‍රියාකාරකම** - හින්දු කෝවිලක දළ රූප සටහනක් ඇඳ ප්‍රධාන ගෘහ නිර්මාණ අංග නම් කරන්න.

II **කණ්ඩායම**

**ක්‍රියාකාරකම** - හින්දු කෝවිලක බිම් සැලැස්මක් ඇඳ එහි ප්‍රධාන කොටස් 03 නම් කරන්න.


- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමාගේ/තුමියගේ සහය ලබාගන්න.

ඇමුණුම 7.1.2.2


## කියවීම් පත්‍රිකාව

- කෝවිල හින්දු ආගමික ගොඩනැගිල්ලකි. එහි බිම් සැලැස්ම ප්‍රධාන කොටස් හතරකින් සමන්විතය. ගෝපර, මණ්ඩප, ප්‍රදක්ෂිණා පථය සහ ගර්භ ගෘහය යනුවෙනි.
- හින්දු කෝවිලක ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය වන්නේ එහි පිවිසුම් දොරටුව වන 'ගෝපුරම්' හෙවත් 'ගෝපුර'යි. මෙහි මූර්තිමය නිර්මාණ රැසක් දැක ගත හැකි ය. හින්දු ආගමික සාහිත්‍යයේ එන විවිධ සිද්ධි හා චරිත මෙම මූර්ති නිර්මාණවලින් නිරූපණය වේ.
- හින්දු ආගමික ගොඩනැගිල්ල විමාන අට්ටාල සිලින්ඩරාකාර පැන්නුම් කුලුනුවලින් යුක්ත වේ.
- ශිව දෙවියාගේ වාහනය වන 'නන්දි' ගවයාගේ රුව බොහෝ හින්දු දේවාල තුළ දැක ගත හැකි අතර එය බොහෝ විට කළු ගලින් නිමවා ඇත.
- ශ්‍රී ලංකාවේ හින්දු ආගමික ගෘහ නිර්මාණ කලාව කෙරෙහි බලපා ඇත්තේ දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ කලාව වේ.
- හින්දු ආගමික සංකේතය ලෙස භාවිත කරන්නේ වෘෂභ කොඩියයි.
- හින්දු දේවාලයේ 'ගර්භ ගෘහ'නමින් හඳුන්වන කොටසෙහි කුඩා හින්දු දේවාලයක හැඩයගත් ආකෘතිමය කලා කෘතියක් වේ.

### හින්දු කෝවිල




හින්දු කොවිලක බිම් සැලැස්ම




1. ගෝපුරම්
2. මණ්ඩපය
3. ප්‍රදක්ෂිණා පථය
3. ගර්භ ගෘහය

**නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1 : විවිධ ආගමික බලපෑම් ඇසුරෙන් සම්භවය වූ කලා අංග අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.3 : ඉස්ලාම් පල්ලියක (මස්ජිදය) මූලිකාංග හා එහි කලා නිර්මාණ හඳුනා ගනිමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- ඉස්ලාම් පල්ලියක රූප සටහනක් ඇඳ එහි ප්‍රධාන ගෘහ නිර්මාණාත්මක අංග නම් කරයි.
- ඉස්ලාම් පල්ලිය ආශ්‍රිතව දැකිය හැකි කලාත්මක අංග නම් කරයි.
- අරාබි මුස්ලිම්වරු වෙළෙඳාම පිණිස ශ්‍රී ලංකාවට පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් පල්ලි ඇති වූ බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම් :**

- ඉස්ලාම් පල්ලිය හා එහි කලාත්මක අංග දැක්වෙන ඡයාරූප, රූප සටහන්, වීඩියෝ පට, සීඩී, පරිගණක යන්ත්‍ර
- ඇමුණුම 7.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 7.1.3.1 ට ඇතුළත් කියවීම් පත්‍රිකා
- විසිතුරු අත් අකුරුවලින් ලියන (Calligrph) රූ සටහන් කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.3.1 :**

- රූපක්ෂර පෙන්වා ඒවා ගැන විමසමින් පාඩමට පිවිසෙන්න.
- මුස්ලිම් පල්ලියේ කලාත්මක නිර්මාණ අංගවන ගෝලාකාර ශිඛරය, මිනරේට් හා අඩ සඳ හා තරුව පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි.)

**පියවර 7.1.3.2 :**

- ඇමුණුම 7.1.3.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුනට ලබා දෙන්න.
- ඇමුණුම 7.1.3.2ට ඇතුළත් කියවීම් පත්‍රිකා අවශ්‍ය පමණ සිසුනට බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 30 යි.)

**පියවර 7.1.3.3 :**

- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුට සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කරුණු හුවමාරු කර ගැනීමට සහාය වන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 40 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.3.1 හා ඇමුණුම 7.1.3.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ශ්‍රී ලංකාවේ මුස්ලිම් පල්ලි ඇතිවීමට බලපෑ සාධක විස්තර කිරීම
- මුස්ලිම් පල්ලියක දළ රූප සටහනක් ඇඳ එහි ප්‍රධාන කොටස් නම් කිරීම
- මුස්ලිම් පල්ලිය ආශ්‍රිතව දැකිය හැකි කලාත්මක නිර්මාණ අංග හඳුනා ගැනීම
- ක්‍රියාකාරීව හා නිරවුල් ලෙස කටයුතු කිරීම
- අන් අයගේ අදහස්වලට ගරු කරමින් කටයුතු කිරීම

**ඇමුණුම 7.1.3.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 7.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා කියවා තේරුම් ගන්න.
- රූප සටහන් අධ්‍යයනය කරන්න.
- සෑම සිසුවෙක්ම පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  - ඉස්ලාම් පල්ලියක දළ රූප සටහනක් ඇඳ එහි ප්‍රධාන කොටස් නම් කරන්න.

  - ඉස්ලාම් පල්ලිය ආශ්‍රිතව දැකිය කලාත්මක නිර්මාණ අංග නම් කරන්න.

- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමාගේ /තුමියගේ සහය ලබා ගන්න.


**ඇමුණුම 7.1.3.2**

## කියවීම් පත්‍රිකාව

### මුස්ලිම් (ඉස්ලාම්) පල්ලිය මස්ජිදය

- අරාබියේ සිට ලංකාවට මුස්ලිම්වරු පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් මස්ජිද ලංකාවේ ඇතිවිය.
- උල් වූ තුඩක් සහිත ගෝලාකාර විශාල ශිඛරය එහි විශේෂ ගෘහ නිර්මාණ අංගයයි. එය කුභා ලෙස හැඳින්වේ.
- පල්ලිය ඉදිරිපිට පිහිටුවා ඇති පොකුණ ද පල්ලියට පිවිසෙන දොරටුව මැදිකර තනා ඇති තොරණ ද පල්ලිය ආශ්‍රිත විශේෂ නිර්මාණාංග වේ.
- මෙයට අමතරව මුස්ලිම් පල්ලියේ දෙපස ඉදිකර ඇති කුලුනු ද එහි ගෘහ නිර්මාණාංගවලට අයත් ය. ඒවා මිනාර් හෙවත් මිනරෙට් යනුවෙන් හඳුන්වයි. මෙම කුලුනු මුදුන්වල ගෝලාකාර ශිඛර දැකගත හැකි ය.
- සෑම කුලුනකම මුදුනෙහි අඩ සඳ හා තාරකා සංකේත මූර්තිමත් කර ඇත.
- මුස්ලිම් පල්ලිවල චිත්‍ර හා ප්‍රතිමා නිර්මාණ දක්නට නොලැබේ.
- ඉස්ලාම් ආගමික ග්‍රන්ථය වන කුරානයේ ඇති පාඨ අරාබි බසින් පල්ලියේ බිත්ති මත සටහන් කර ඇත.
- මෙම පාඨ අත් අකුරු ලිවීමේ කලාවට (Calligraphy) අනුව විවිධ හැඩ මතුවන සේ අක්ෂර කලාත්මකව නිර්මාණය කර ඇත.


## ඉස්ලාම් පල්ලිය මස්ජිදය






A - අඩ සඳ හා තරුව
B - ශිඛරය /කුෆා/ කුම්බා (Dome)
C - මිනාර්/මිනරෙට්

## විවිධ හැඩ මතුවන ලෙස ලියන ලද අරාබි අක්ෂර









**නිපුණතාව 7.0 :** **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1 :** **විවිධ ආගමික බලපෑම් ඇසුරෙන් සම්භවය වූ කලා අංග අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.4 :** **''ක්‍රිස්තියානි දේවස්ථානයක නිර්මාණ ලක්ෂණ හඳුනාගනිමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව :** **02 යි.**

**ඉගෙනුම් පල :**

- රෝමන් ක්‍රමයේ දේවස්ථානයක රූප සටහන් ඇඳ කොටස් නම් කරයි.
- ගොතික් ක්‍රමයේ දේවස්ථානයක රූප සටහන් ඇඳ කොටස් නම් කරයි.
- දේවස්ථානයක බිම් සැලැස්මක් ඇඳ කොටස් නම් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.
- ක්‍රිස්තියානි ගෘහ නිර්මාණ කලාව සම්බන්ධ රංජිත (වර්ණවත්) වීදුරු චිත්‍ර කලාව පිළිබඳ දැනුවත් වෙයි.

**ගුණාත්මක යෙදවුම් :**

- ක්‍රිස්තියානි දේවස්ථාන හා එහි බිම් සැලැස්ම දැක්වෙන ඡායාරූප
- ක්‍රිස්තියානි දේවස්ථාන පිළිබඳ විස්තර දැක්වෙන වීඩියෝ පට, සී.ඩී තැටි, පරිගණක යන්ත්‍ර
- ඇමුණුම 7.1.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 7.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.4.1 :**

- ක්‍රිස්තියානි දේවස්ථාන හා බිම් සැලැස්ම දැක්වෙන ඡායාරූප සීඩී, පරිගණක යන්ත්‍ර උපයෝගි කරගෙන සිසුනට පෙන්වන්න.
- පෙන්වන ලද ඡායාරූප පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ක්‍රිස්තියානි ආගමට සම්බන්ධ ගොඩනැගිල්ලක් ලෙස ක්‍රිස්තියානි පල්ලිය හඳුන්වා දෙන්න.
- ක්‍රිස්තියානි දේවස්ථානයක බිම් සැලැස්ම කුරුසයක හැඩය ගන්නා බවත් අල්තාරය හෙවත් පූජාසනය ප්‍රධාන නිර්මාණ අංගයක් බවත් පෙන්වා දෙන්න.

(මිනිත්තු 15 යි.)

**පියවර 7.1.4.2 :**

- ඇමුණුම 7.1.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා සිසුනට බෙදා දෙන්න.
- ඇමුණුම 7.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා සිසුනට බෙදා දෙන්න.
- කණ්ඩායම් 04කට සිසුන් වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායමට අදාළ ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- එම කරුණු පෙළ ගැස්වීමට සහය වන්න.

(මිනිත්තු 40 යි.)

**පියවර 7.1.4.3 :**

- රැස් කරගත් කරුණු ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථා දෙන්න.

- එම කරුණු පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- සංවර්ධනාත්මක උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 25 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.4.1 හා ඇමුණුම 7.1.4.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න

- ක්‍රිස්තියානි දේවස්ථානයක බිම් සැලැස්ම ඇඳ එහි කොටස් නම් කිරීම
- රෝමන් දේවස්ථානය හා ගොතික් දේවස්ථානය ඇඳ ඒවායේ කොටස් නම් කිරීම
- රංජිත වීදුරු කලාව දේවස්ථාන සමඟ බැඳී පවතින කලාත්මක නිර්මාණ විශේෂයක් බව පිළිගැනීම
- ශ්‍රි ලංකාවේ ක්‍රිස්තියානි පල්ලි කිහිපයක් නම් කිරීම
- කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියාකාරීව කටයුතු කිරීම

**ඇමුණුම 7.1.4.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 7.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා කියවා තේරුම් ගන්න.
- රූප සටහන් අධ්‍යයනය කරන්න.
- ඔබ කණ්ඩායමට අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

I **කණ්ඩායම**

**ක්‍රියාකාරකම** - රෝමන් ක්‍රමයේ දේවස්ථානයක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

II **කණ්ඩායම**

**ක්‍රියාකාරකම** - ගොතික් ක්‍රමයේ දේවස්ථානයක රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න.

III **කණ්ඩායම**

**ක්‍රියාකාරකම** - දේවස්ථානයක බිම් සැලැස්මක් ඇඳ කොටස් නම් කරන්න.

IV **කණ්ඩායම**

**ක්‍රියාකාරකම** - ශ්‍රී ලංකාවේ දේවස්ථාන කිහිපයක් හා ඒවා පිහිටි ප්‍රදේශ ඇතුළත් වගුවක් පිළියෙල කරන්න.


ඇමුණුම 7.1.4.2

## කියවීම් පත්‍රිකාව

- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රිස්තු දහම ව්‍යාප්ත වූයේ 16 වන සියවසේදී ය.
- ක්‍රිස්තියානි දේවස්ථාන ඉදි කිරීම සඳහා පෘතුගීසීන් මුල් විය.
- ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දේවස්ථාන රෝමානු හා ගොතික් යන නිර්මාණ ශෛලි 2 අනුව නිර්මාණය කර ඇත.
- රෝමානු ක්‍රමයේ දේවස්ථාන බොකු වහල හා රවුම් ආරුක්කුවලින් සමන්විත වේ. මෙම දේවස්ථානවල ප්‍රධාන දොරටුවට ඉහළින් අලංකාර වීදුරුවලින් නිමවා ඇති වෘත්තාකාර කවුළුවකි. එය Rose window ලෙස හැඳින්වේ.
- ගොතික් ක්‍රමයේ දේවස්ථාන තුඩු සහිත ආරුක්කුවලින් හා දෙපසට දළ බෑවුම් ඇති වහල සහිතව නිර්මාණය කර ඇත. මෙම දේවාස්ථානවල තුඩු සහිත කවුළු රංජිත වීදුරුවලින් අලංකාර කර ඇත.
- රංජිත වීදුරු නිර්මාණවල ක්‍රිස්තියානි ආගමට අයත් විවිධ අවස්ථා හා චරිත නිරූපණය කර ඇත.
- දේවස්ථානයක බිම් සැලැස්ම කුරුසික හැඩය ගන්නා අතර එය අල්තාරය, කාමර, දිග් ශාලාව, කුලුනු, බයිබලය කියවන ස්ථානය හා පිවිසුම් දොරටුව යන අංගවලින් සමන්විත වේ.
- දිග් ශාලාවේ එක් කොනක 'අල්තාරය' හෙවත් 'පූජාසනය' අලංකාර වැටක් සහිත ව නිමකොට ඇති අතර ඒ පිටුපස බිත්තියේ බොහෝ විට චිත්‍රයෙන්, කැටයමින් හෝ රංජිත වීදුරුවලින් ක්‍රිස්තුස්වහන්සේගේ චරිත අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇත.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතු දේවස්ථාන කිහිපයක් පහත දැක්වේ.


  බොරැල්ලේ - සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය
  කොළඹ - ලන්දේසි පල්ලිය
  ගාල්ල - බලකොටුව තුළ පිහිටි කිතු දේවස්ථානය

**කිතු දේවස්ථානයක බිම් සැලැස්ම**




1. අල්තාරය
2. කාමර
3. දිග් ශාලාව
4. ස්තම්භ(කුලුනු)
5. බයිබලය කියවන ස්ථානය
6. පිවිසුම් දොරටුව

## රෝමන් ක්‍රමයේ දේවස්ථානය




## ගොතික් ක්‍රමයේ දේවස්ථානය

